ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

# වාර්ෂික වාර්තාව
# 2024

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

# වාර්ෂික වාර්තාව

# 2024

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

41/1,  නව පාර්ලිමේන්තු පාර,

පැලවත්ත,

බත්තරමුල්ල.

දුරකථන අංකය: 011 2786495

ෆැක්ස් අංකය: 011 2786493

වෙබ් අඩවිය: www.naqda.gov.lk

# පටුන


| | | |
|---|---|---|
| 1 | ආයතනික තොරතුරු | 3 |
| 2 | සභාපතිතුමාගේ සමාලෝචනය | **7** |
| 3 | තිරසර සංවර්ධනයට අනුකූල වීම | 17 |
| 4 | අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව | 19 |
| 5 | විගණකාධිපතිගේ වාර්තාව | 45 |
| 6 | වාර්ෂික ගිණුම් සහිත ශේෂ පත්‍රය | 57 |

# ආයතනික තොරතුරු

**<u>ආයතනයේ නම</u>**

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය**

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 1998 අංක 53 දරන පාර්ලිමේන්තු පනත මගින් ධීවර අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලදි. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ ජලජීවී වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ප්‍රධාන රාජ්‍ය ආයතනය වේ.

15/09/2011 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛන අංක 58(2) අනුව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ප්‍රවර්ධන ආයතනයක් (Promotional Institute) ලෙස වර්ගීකරණය කර ඇත.

**<u>දැක්ම</u>**

තිරසාර හා අපනයනය අරමුණු කරගත් ජලජීවී වගාව තුළින් ජාතික ආහාර සුරක්ෂිතතාව සහ ආර්ථික සමෘද්ධිය සඳහා දායක වෙමින් දකුණු ආසියාවේ ප්‍රමුඛතම ජලජීවී වගා සේවා සපයන්නා වීම.

**<u>මෙහෙවර</u>**

- ජාතියේ ආහාර සුරක්ෂිතතාව සහතික කරන දිගුකාලීන තිරසාර ජලජීවී වගා පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම
- අපනයනය කේන්ද්‍ර කරගත් ජලජීවී වගාවන් සඳහා සහාය වීමෙන් ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම් වැඩි කිරීම
- ජලජීවී වගා අංශයේ වර්ධනය සඳහා නව්‍ය, කාර්යක්ෂම සහ පරිසර හිතකාමී සේවාවන් සැපයීම
- තාක්ෂණික සහාය, ධාරිතා වර්ධනය සහ සම්පත් කළමනාකරණය තුළින් ප්‍රජාවන් සහ පාර්ශවකරුවන් බල ගැන්වීම

**<u>අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

2006 අංක 23 දරන පනතින් සංශෝධිත 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ පනතේ 3 වන වගන්තිය ප්‍රකාර ව පාලක මණ්ඩලය පත් කළ සාමාජිකයින් පස් දෙනෙකුගෙන් (05) හා නිල බලයෙන් පත් වූ සාමාජිකයින් අට දෙනෙකුගෙන් (08) සමන්විත වේ.

පහත සඳහන් සාමාජිකයින් 2024 වර්ෂය තුළ පාලක මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් සේවය කළ අතර, වසර තුළ රැස්වීම් හතක් (07) පවත්වා ඇත.

<u>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්</u>

| පාලක මණ්ඩලයේ සාමාජිකයින් -2024 | | | |
|---|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ගරු ධීවර අමාත්‍යතුමා විසින් පත් කරන ලද සාමාජිකයින් | | | |
| නම | | තනතුර | සේවා කාලය |
| 01 | බී. විජයරත්න මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සභාපති | 2023/ 09 04 - 2024/10/08 |
| 02 | ගනේෂමූර්ති රාජ්කුමාර් මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2022/08/10 - 2024/11/10 |
| 03 | බී. පී. එල්. යූ. බාලසූරිය මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2021/05/04 - 2024/1/10 |
| නිල වශයෙන් පත් කරන ලද සාමාජිකයින් | | | |
| 04 | එස්. ජේ. කහවත්ත මහතා | නිල වශයෙන් පත් කර ඇති සාමාජික | 2019/07/02 - 2024/12/31 |
| 05 | ආර්. එච්. එම්. පී. අබේකෝන් මහත්මිය | නිල වශයෙන් පත් කර ඇති සාමාජික | 2020/02/20 - 2024/12/31 |
| 06 | මහාචාර්ය එම්.ජේ.එස්.විජයරත්න මහතා | නිල වශයෙන් පත් කර ඇති සාමාජික | 2022/02/01 - 2024/10/19 |
| 07 | ටී. ඒ. ඩී. ධම්මික ප්‍රේමරත්න මහතා | නිල වශයෙන් පත් කර ඇති සාමාජික | 2022/03/04 - 2024/11/07 |
| 08 | චන්දිකා ඇතුගල මහත්මිය | නිල වශයෙන් පත් කර ඇති සාමාජික | 2022/09/06 - 2024/12/31 |
| 09 | පී. එච්. හඳුන්හේවා මිය | නිල වශයෙන් පත් කර ඇති සාමාජික | 2020/02/12 - 2024/12/31 |
| 10 | ඩී. වී. උපුල් මහතා | නිල වශයෙන් පත් කර ඇති සාමාජික | 2023/04/28 - 2024/05/16 |
| 11 | ඉංජි. ඩබ්. කේ. එස්. වික්‍රමපාල මහතා | නිල වශයෙන් පත් කර ඇති සාමාජික | 2024/06/10 - 2024/12/31 |

**<u>2024 සැප්තැම්බර් මසට පසුව පත් වූ නව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්</u>**

| පාලක මණ්ඩලයේ සාමාජිකයින් -2024 | | | |
|---|---|---|---|
| **අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ගරු ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා විසින් පත් කරන ලද සාමාජිකයින්** | | | |
| **නම** | | **තනතුර** | **සේවා කාලය** |
| 01 | කේ. පී. කිත්සිරි ධර්මප්‍රිය මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සභාපති | 2024/10/09 - 2024/12/31 |
| 02 | ඒ.බී.ඒ.කේ. ගුණරත්න මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2024/10/11 - 2024/12/31 |
| 03 | ජගත් සිරිනිමල ත්‍රිමහවිතාන | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2024/10/11 - 2024/12/31 |
| 04 | සුමීර රන්දික ප්‍රනාන්දු මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2024/10/11 - 2024/12/31 |
| 05 | නුවන් ලියනගේ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2024/10/11 - 2024/12/31 |
| **නිල වශයෙන් පත් කරන ලද සාමාජිකයින්** | | | |
| 04 | ජේ. ඒ. කේ. මාර්ක් මහතා | නිල වශයෙන් පත් කර ඇති සාමාජික | 2024/10/30 - 2024/12/31 |
| 05 | ආචාර්ය සනත් හෙට්ටිආරච්චි මහතා | නිල වශයෙන් පත් කර ඇති සාමාජික | 2024/10/20 - 2024/12/31 |
| 06 | ඩී. ඒ. සී. ඩී. පිරිස් මහත්මිය | නිල වශයෙන් පත් කර ඇති සාමාජික | 2024/12/11 - 2024/12/31 |

**ප්‍රධාන කාර්යාලය**

41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල

**විගණක**

විගණකාධිපති දෙපාර්තමේන්තුව

**බැංකුකරුවෝ**

මහජන බැංකුව, බත්තරමුල්ල

ලංකා බැංකුව, පැලවත්ත

# සභාපතිතුමාගේ සමාලෝචනය

**2024 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.**

## හැඳින්වීම

2024 ජනවාරි මස 01 දින සිට ආරම්භ වන මාස 12ක කාලසීමාව තුළ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ කාර්යය සාධනය පහත පරිදි වේ.

### මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය

**වගුව 1 - පසුගිය වර්ෂවල මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා නිෂ්පාදනය**

| වර්ෂය | මිරිදිය ධීවර හා ජලජීවී වගා නිෂ්පාදනය (මෙ.ටො.) | වෙරළබඩ ජලජීවී වගාව හා ඉස්සන් නිෂ්පාදනය (මෙ.ටො.) | මුළු නිෂ්පාදනය (මෙ.ටො.) | පසුගිය වසරට වඩා නිෂ්පාදනයෙහි ඉහළ යාම ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|
| **2019** | 77,340 | 13,240 | 90,580 | 3 |
| **2020** | 89,520 | 12,700 | 102,220 | 13 |
| **2021** | 85,560 | 18,890 | 104,450 | 2 |
| **2022** | 100,930 | 15,960 | 116,890 | 12 |
| **2023** | 99,640 | 15,210 | 114,850 | -2 |
| **2024** | 93,290 | 9,830 | 103,120 | -10 |

*මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය*

2024 දී ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර හා ජලජීවී වගා නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 103,120 ක් වූ අතර එය 2023 ට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 11,730 ක පහත වැටීමක් පිළිබිඹු කරයි. ප්‍රධාන වශයෙන් නිත්‍ය ජලාශ සහ කාලීන ජලාශවලින් ලබාගත් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 93,290 දක්වා 6% කින් පහත වැටී ඇත. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හමුවේ මසුන් ජලාශ වලින් පිට වීම සහ 2023 වසරේ දී ජලාශ තුළ තැන්පත් කළ මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණය අඩු මට්ටමක පැවතීම ය. මෙම වසරේ ඉස්සන් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 7,320 ක් වුව ද එය 2023 වසරට සාපේක්ෂව 37% අඩුවී ඇත. ඉස්සන් ආහාර සහ විදුලි ගාස්තු ඉහළ යෑමෙන් සිදු වූ සෘජු බලපෑම මඟින් නිෂ්පාදන පිරිවැය අධික වීම හේතුවෙන් ඉස්සන් නිෂ්පාදකයින් ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම් අඩු කිරීම සහ රෝග තත්ත්ව මේ සඳහා හේතු විය. මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා නිෂ්පාදනයේ වසරින් වසර සංසන්දනයක් **1** වගුවේ දක්වා ඇත.

## විදේශ විනිමය ඉපයීම හා ග්‍රාමීය ආර්ථිකය සඳහා දායකත්වය

2024 වසරේ මිරිදිය මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනවල මුළු වටිනාකම රුපියල් බිලියන 38ක් ලෙස ගණනය කර ඇති අතර, එමගින් ග්‍රාමීය ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලැබී ඇත. ඉස්සන් අපනයන මගින් ඩොලර් මිලියන 29.53ක විදේශ විනිමය ආදායමක් ලබාගත් අතර, එය 2023 වසරේ ලැබූ ඩොලර් මිලියන 31.73ට සාපේක්ෂව 7% කින් අඩු වී ඇත. එසේම, විසිතුරු මත්ස්‍ය අපනයනයෙන් ඩොලර් මිලියන 24.47ක විදේශ විනිමයක් උපයා ගෙන ඇති අතර එය 2023 වසරේ ලැබූ ඩොලර් මිලියන 26.38 ට සාපේක්ෂව 7%ක අඩු වීමකි.

*(මූලාශ්‍ර: www.fisheries.gov.lk සහ නැක්ඩා , සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය)*

## මත්ස්‍ය ඇසිත්තන් නිෂ්පාදනය හා බෙදා හැරීම

උඩවලව, දඹුල්ල, ඉඟිනියාගල, ඉරණමඩු, කලාවැව, නුවරඑළිය, පොළොන්නරුව සහ මුරුතවෙල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මගින් 2024 වර්ෂයේ දී මත්ස්‍ය පැටවුන් මිලියන 126.97ක් නිෂ්පාදනය කර ඇත. මෙම නිෂ්පාදනය පෙර වසරට සාපේක්ෂව 12% කින් අඩු වූ අතර, මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2024 වර්ෂයේ මුල් මාසවල මත්ස්‍ය අභිජනන ක්‍රියාවලිය සඳහා පැවති උෂ්ණත්ව තත්ත්වය යි. මෙම නිෂ්පාදිත ඇසිත්තන්ගෙන් වැඩි ප්‍රමාණයක් මත්ස්‍ය ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම සඳහා පෞද්ගලික පොකුණු, කූඩු, කොටු සහ ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක සඳහා නිකුත් කර ඇත. ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වලින් මත්ස්‍ය ඇසිත්තන් ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක, පෞද්ගලික පොකුණු සහ කූඩු සඳහා නිකුත් කිරීම 2023 වසරේ මිලියන 76.53 ට සාපේක්ෂව 2024 දී මිලියන 75.37 දක්වා 2% කින් අඩු වී ඇත. 2019 වසරේ සිට 2024 වසර දක්වා මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය සහ බෙදාහැරීම වගුව 2 හි දක්වා ඇත.

වගුව 2 - ඇසිත්තන් නිෂ්පාදනය සහ බෙදාහැරීම (මිලියන)

| නිෂ්පාදන ඒකක | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|
| ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානවල ඇඟිල්ලන් නිෂ්පාදනය සඳහා | 57.85 | 100.03 | 113.11 | 81.22 | 68.34 | 51.60 |
| ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක සඳහා ඇසිත්තන් නිකුත් කිරීම | 20.43 | 14.60 | 31.05 | 35.60 | 18.82 | 9.82 |
| පෞද්ගලික පොකුණු සඳහා ඇසිත්තන් නිකුත් කිරීම | 23.73 | 23.40 | 36.59 | 60.43 | 22.48 | 26.95 |
| කූඩු සඳහා ඇසිත්තන් නිකුත් කිරීම | 42.31 | 47.60 | 59.01 | 53.13 | 35.23 | 38.60 |
| එකතුව | **144.32** | **185.63** | **239.76** | **230.38** | **144.86** | **126.97** |

*මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය*

**මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය**

2024 දී ශ්‍රී ලංකාවේ මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය මිලියන 75.18 වූ අතර එය පෙර වසරට වඩා 5% ක වර්ධනයකි. මෙම නිෂ්පාදනය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන, ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක, කූඩු හා පෞද්ගලික පොකුණු වලින් ලබා ගන්නා ලදී. මුළු ඇඟිල්ලන් නිෂ්පාදනයෙන් 37% ක් සෘජුවම අධිකාරිය විසින් නිෂ්පාදනය කරන ලද අතර, ඉතිරිය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මඟින් සපයන ලද මත්ස්‍ය ඇසිත්තන් වර්ධනය කර පෞද්ගලික පොකුණු, කූඩු සහ ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක මඟින් නිෂ්පාදනය කරන ලදි. 2019 - 2024 කාල පරිච්ඡේදය තුළ විවිධ නිෂ්පාදන ඒකකවල සම්පූර්ණ මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය වගුව 3 හි පෙන්වා දී ඇත.

වගුව 3 - මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය (මිලියන)

| නිෂ්පාදන ඒකකය | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|
| ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල ඇඟිල්ලන් නිෂ්පාදනය | 29.17 | 36.40 | 42.14 | 47.71 | 25.50 | 27.50 |
| ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය නිෂ්පාදන ඒකක | 15.07 | 12.49 | 17.45 | 21.26 | 10.30 | 4.94 |
| පෞද්ගලික පොකුණු | 14.26 | 15.14 | 26.75 | 47.00 | 15.90 | 17.01 |
| කූඩු / කොටු | 30.09 | 31.91 | 25.24 | 29.46 | 20.10 | 25.73 |
| එකතුව | **88.59** | **95.94** | **111.58** | **145.43** | **71.80** | **75.18** |

*මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය*

## මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම

ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන, පෞද්ගලික පොකුණු, ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක සහ කූඩු මඟින් නිෂ්පාදනය කරන ලද මත්ස්‍ය ඇඟිල්ලන් වගුව 4හි දක්වා ඇති පරිදි ජලාශ වල තැන්පත් කිරීම සිදු කරන ලදි. 2024 වසර තුළ මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම තුළින් 2025 වසරේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට ඉවහල් වේ.

වගුව 4 - මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම - 2024

| ජලාශ වර්ගය | ජලාශ / ඒකක සංඛ්‍යාව | මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම (මිලියන) |
|---|---|---|
| විශාල පරිමාණ ජලාශ | 39 | 23.25 |
| මධ්‍යම පරිමාණ ජලාශ | 74 | 20.56 |
| කුඩා පරිමාණ ජලාශ | 270 | 22.50 |
| කාලීන ජලාශ | 285 | 5.45 |
| වතු ජලාශ | 12 | 0.52 |
| පොකුණු / කූඩු / කොටු | 303 | 1.42 |
| විල්ලු, ගංඟා සහ කළපු | 8 | 0.66 |
| එකතුව | **993** | **74.36** |

*මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය*

**මිරිදිය ඉස්සන් පසු කීටයන් නිෂ්පාදනය**

2024 දී ජලාශ වල තැන්පත් කිරීම සඳහා පම්බල, කල්ලරාව හා කහඳමෝදර මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන සහ පෞද්ගලික අභිජනනාගාරය මඟින් මිරිදිය ඉස්සන් පසු කීටයන් මිලියන 37.95 නිකුත් කර ඇත. කෙසේ වෙතත්, මිරිදිය ඉස්සන් පසු කීටයන් සඳහා ධීවර සමිති වලින් ඇති ඉල්ලුම අඩු වීම හේතුවෙන් 2023 වසරේ නිකුත් කර ඇති මිලියන 46.10 ට සාපේක්ෂව 18% ක පහත වැටීමක් පෙන්නුම් කරයි. 2024 වසරේ ජලාශ වර්ගය අනුව මිරිදිය ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම් වගුව 5හි දක්වා ඇත.

වගුව *5* - **මිරිදිය ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම - 2024**

| ජලාශ වර්ගය | ජලාශ සංඛ්‍යාව | තැන්පත් කරන ලද පසු කීටයන් (මිලියන) |
|---|---|---|
| විශාල පරිමාණ ජලාශ | 21 | 11.25 |
| මධ්‍යම පරිමාණ ජලාශ | 40 | 13.54 |
| කුඩා පරිමාණ ජලාශ | 86 | 10.97 |
| කාලීන ජලාශ | 19 | 0.96 |
| පොකුණු | 25 | 0.23 |
| කළපු | 01 | 0.99 |
| වෙනත් | 01 | 0.01 |
| **එකතුව** | **193** | **37.95** |

*මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය*

***මත්ස්‍ය බීජ / ඉස්සන් පැටවුන් තැන්පත් කිරීමේ වැඩසටහන***

රජය විසින් රු. මිලියන 200ක ප්‍රතිපාදන 2024 වසරේ මත්ස්‍ය බීජ තැන්පත් කිරීමේ වැඩසටහන සඳහා වෙන් කරන ලදි. මේ යටතේ මත්ස්‍ය ඇඟිත්තන් මිලියන 14.62 ක්, මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 13 ක් සහ මිරිදිය ඉස්සන් පසු කීටයන් මිලියන 13.52 ක් ජලාශවල සහ කුඩුවල තැන්පත් කර ඇත. මත්ස්‍ය බීජ නිෂ්පාදනයට සහාය වීම සඳහා මත්ස්‍ය ආහාර, ආටීමියා, හෝමෝන, රසායනික ද්‍රව්‍ය, බිලීවිං සහ ට්‍රයික්ලෝර්ෆොන් වැනි අත්‍යවශ්‍ය යෙදවුම් ද සපයන ලදි. මෙම වැඩසටහන සඳහා දරන ලද මුළු වියදම රු. මිලියන 200 කි.

**ජලාශවල ධීවර කළමනාකරණ කටයුතු**

2024 දී, නිත්‍ය ජලාශවල මිරිදිය ධීවර කටයුතු කළමනාකරණය කිරීමේ කාර්යයන් අතරට වැටලීම් හරහා නීති විරෝධී මසුන් ඇල්ලීම අවම කිරීම සඳහා අධිකාරිය සහ ධීවර සංගම්වල ඒකාබද්ධ ක්‍රියාමාර්ග මෙන් ම පවතින ග්‍රාමීය ධීවර සංවිධාන ශක්තිමත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ද ඇතුළත් විය. වසර තුළ මිරිදිය ධීවර යාත්‍රා 9,647ක් ක්‍රියාත්මක කර ඇති අතර මිරිදිය ධීවරයින් 56,153ක් ධීවර කටයුතුවල නිරත විය.

**ඉස්සන් වගා කර්මාන්තය**

ශ්‍රී ලංකාවේ ඉස්සන් වගා කර්මාන්තය අධිකාරියෙහි අඛණ්ඩ නිරීක්ෂණ සහ අධීක්ෂණය මඟින් වගා නියාමනය, රෝග පැතිරීම වැළැක්වීම සහ තිරසර නිෂ්පාදන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහතික කරයි. කෙසේ වෙතත්, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී මුළු ඉස්සන් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 7,320 දක්වා 37% කින් අඩු වී ඇත. මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉස්සන් ආහාර සහ විදුලි ගාස්තු ඉහළ යාමෙන් නිෂ්පාදන පිරිවැය අධික වීම හේතුවෙන් නිෂ්පාදකයින් ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම් අඩු කිරීම සහ රෝග තත්ත්ව හේතුවෙන් අස්වැන්න අඩු වීමය. එහි ප්‍රතිඵලයක් ලෙස ඉස්සන් අපනයනය ද 2023 වසරේ මෙට්‍රික් ටොන් 4,020 සාපේක්ෂව 2024 දී මෙට්‍රික් ටොන් 3,432 දක්වා 15% කින් පහත වැටී ඇත. ඉහළ යන මෙහෙයුම් පිරිවැය මධ්‍යයේ ලාභදායීතාවය පවත්වා ගැනීමේ දී කර්මාන්තය මුහුණ දෙන අභියෝග මෙම නිෂ්පාදන අඩු වීම මඟින් අවධාරණය කෙරේ.

2024 දී, අඛණ්ඩ නියාමන සහ අධීක්ෂණ ක්‍රියාකාරකම් ලෙස අධිකාරිය විසින් ජලජීවී වගා කළමනාකරණ බලපත්‍ර 272ක් නිකුත් කරන ලද අතර ඉන් 236 ක් ඉස්සන් ගොවිපළ සඳහා ද 36 ක් ඉස්සන් අභිජනනාගාර සඳහා ද නිකුත් කරන ලදි. ගොවිපළ වල තැන්පත් කිරීම සඳහා නිරෝගී පසු කීටයන් සැපයීම සඳහා වසර තුළ ඉස්සන් පසු කීටයන් සහ මව් ඉස්සන්ගේ රෝග සඳහා PCR පරීක්ෂණ 2,540 ක් බත්තුළුඔය ස්ථාපිත මත්ස්‍ය රෝග නිර්ණය සහ සෞඛ්‍ය කළමනාකරණ විද්‍යාගාරය මගින් සිදු කර ඇත.

මෙම වසරේ, පුත්තලම, මඩකලපුව, මන්නාරම, කිලිනොච්චි සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන 49 ක් සහ ඉස්සන් ගොවිපල 755 ක් ක්‍රියාත්මක විය. 2024 දී පෞද්ගලික අභිජනන මධ්‍යස්ථාන මගින් *Peneaus monodon*

පසු කීටයන් මිලියන 73.2 ක් හා *Litopeneaus vannamei* පසු කීටයන් මිලියන 352.9 නිෂ්පාදනය කර ඇත.

### විසිතුරු මසුන් සහ ජලජ පැළෑටි වගාව

විසිතුරු මත්ස්‍ය හා ජලජ පැළෑටි නිෂ්පාදනය ශක්තිමත් කිරීම මෙන් ම අපනයන වැඩි කිරීම සඳහා නව විසිතුරු මත්ස්‍ය ප්‍රභේද බිහි කිරීම, තාක්‍ෂණය දියුණු කිරීම, මව් මසුන් සැපයීම, මත්ස්‍ය රෝග නිර්ණය, පුහුණුව සහ තාක්‍ෂණික සහාය ලබා දීම සඳහා අධිකාරිය ක්‍රියාකාරීව නිරත වේ. රම්බොඩගල්ල, ගිනිගත්හේන සහ සෙවනපිටිය යන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන විශේෂයෙන් විසිතුරු මත්ස්‍ය හා ජලජ ශාක නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු කරයි. මෙම කාලය තුළ, ගිනිගත්හේන මධ්‍යස්ථානයේ දී නව ප්‍රභේද 12 ක් (Swordtail – Pink wag, Snow white, Platy – Rainbow, Blue wag, Blue diamond, Red halfmoon, Sunset halfmoon, Whiterin, Platy fintail - Blue wag, Variatus wag, Sunset wag, Black) සහ රම්බොඩගල්ල මධ්‍යස්ථානයේ දී නව ප්‍රභේද 2 ක් (Guppy - Luminous Green Chest, Lemon Cobra) නිෂ්පාදනය කරන ලදි.

රම්බොඩගල්ල පටක රෝපණ විද්‍යාගාරය විසිතුරු ජලජ ශාක පටක රෝපණ සඳහා විශේෂිත වේ. මෙහි මූලික අරමුණ වනුයේ තාක්ෂණික දැනුම ලබා දීම සහ ජලජ පැළෑටි අපනයනය ප්‍රවර්ධනය තුළින් විදේශ විනිමය ඉපයීමය. 2024 වර්ෂයේ දී ජලජ පැළෑටි 56,323 ක් නිෂ්පාදනය කරන ලදි.

2024 වසරේ දී මව් මසුන් 172,257 ක් ඇතුළුව විසිතුරු මසුන් මිලියන 4.03 ක් නිෂ්පාදකයින්ට හා අපනයනකරුවන්ට අලෙවි කර ඇත. මිරිදිය විසිතුරු මසුන් අපනයන අතර ගප්පි, ස්වෝඩ්ටේල්, ප්ලේටි, බාර්බ්ස්, ටෙට්‍රා, ඒන්ජල්, ගුරමි සහ කැට්ෆිෂ් වඩාත් ජනප්‍රිය විශේෂ වන අතර බහුතරය ගප්පි වලින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ නිත්‍ය අපනයන සමාගම් 60 ක් පමණ ඇත. 2024 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ විසිතුරු මසුන් මිලදී ගත් ප්‍රධාන රටවල් අතරට ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ඕස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, සවුදි අරාබිය, කැනඩාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, දකුණු කොරියාව සහ පෝලන්තය ඇතුළත් විය. මීට අමතරව, මෙම වසර තුළ පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර, විසිතුරු මත්ස්‍ය වගාව පිළිබඳ පුද්ගලයින් 1,732 දෙනෙකු පුහුණු කරන ලදි.

**සම්ප්‍රදායික නොවන ජලජීවී වගාවන්**

- **මුහුදු කූඩැල්ලන් අභිජනනය හා වගාව**

මුහුදු කූඩැල්ලන් වගාව ශ්‍රී ලංකාවේ ජලජීවී වගා ක්ෂේත්‍රය තුළ ප්‍රචලිත වෙමින් පවතින අංශයකි. විශේෂයෙන් චීනය සහ අනෙකුත් නැගෙනහිර ආසියාතික රටවල ප්‍රණීත ආහාරයක් ලෙස සලකනු ලබන සහ ඖෂධීය ගුණ ඇති මුහුදු කූඩැල්ලන් සඳහා ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉහළ මිලක් පවති. අපනයන වෙළෙඳපොළ තුළ මුහුදු කූඩැල්ලන් සඳහා වැඩි ඉල්ලුමක් පවතින බැවින් දේශීය ධීවර ප්‍රජාව ගේ ජීවනෝපාය සඳහා සහ රටට අවශ්‍ය විදේශ විනිමය ගෙන ඒම සඳහා මුහුදු කූඩැල්ලන් වගාව ප්‍රවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

2024 වසරේ දී, අධිකාරිය විසින් ක්‍රියාත්මක අභිජනනාගාරය සහ පෞද්ගලික අභිජනනාගාර වලින් මුහුදු කූඩැල්ලන් පැටවුන් 273,750 ක් නිෂ්පාදනය කර ඇත. මන්නාරම, කිලිනොච්චි, යාපනය සහ පුත්තලම යන ප්‍රදේශවල පෞද්ගලික අංශය විසින් මුහුදු කූඩැල්ලන් වගාව සිදු කරන අතර මෙම වසරේ දී මුහුදු කූඩැල්ලන් මෙ.ටොන් 479 (තෙත් බර) අස්වැන්නක් ලබා ගෙන ඇත.

- **මුහුදු පැළෑටි වගාව**

උතුරු මුහුදේ ප්‍රජා සහභාගීත්වය තුළින් මුහුදු පැළෑටි වගාව සිදු කරන අතර 2024 වසරේ දී මුහුදු පැළෑටි අස්වැන්න මෙට්‍රික් ටොන් 795 (තෙත් බර) වූ අතර වගා ප්‍රදේශය ආසන්න වශයෙන් හෙක්ටයාර 100 කි.

- **මොදා මත්ස්‍ය අභිජනනය සහ වගාව**

මීගමුව කළපුව, මන්නාරම, ගාල්ල හා මඩකළපුව යන දිස්ත්‍රික්කවල මොදා මත්ස්‍ය වගාව සඳහා පුද්ගලික අංශය නියැලී ඇත. 2024 වර්ෂයේ මොදා මත්ස්‍ය පැටවුන් මිලියන 2.48 තැන්පත් කර ඇති අතර මෙ.ටොන් 978 ක මොදා මත්ස්‍ය අස්වැන්නක් ලබා ගෙන ඇත.

මහා පරිමාණ සමුද්‍ර කූඩු තුළ මොදා මත්ස්‍ය වගාවක් ත්‍රිකුණාමල මුහුදේ ක්‍රියාත්මක වන අතර මෙ.ටොන් 955ක මොදා අස්වැන්නක් මෙම සමුද්‍ර කූඩු මඟින් ලබා ගෙන ඇත.

**නීතිමය කටයුතු**

2024 වර්ෂයේ දී නඩු හයක් අධිකාරියට එරෙහිව පවරා ඇති අතර, එයින් හතරක් බේරුම්කරණ නඩු වන අතර දෙකක් කම්කරු විනිශ්චය සභා නඩු වේ. අධිකාරිය මගින් නඩු තුනක් වෙනත් ආයතන වලට එරෙහිව පවරා ඇති අතර එයින් දෙකක් බේරුම්කරණ නඩු වන අතර, එකක් රක්ෂණ නඩුවකි. මෙයට අමතරව 2021 වසරේ ආරම්භ කරන ලද ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 106 ක ට එරෙහිව පවරන ලද නඩු පවත්වා ගෙන ගොස් ඇත.

**මානව සම්පත් තොරතුරු**

2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සේවක සංඛ්‍යාව 600ක් වූ අතර පුරප්පාඩු සේවක සංඛ්‍යාව 120 ක් විය. සේවකයින් 20 දෙනෙකු සඳහා දේශීය පුහුණුවීම් ද 10 දෙනෙකු සඳහා විදේශීය පුහුණුවීම් ද ලබා දී ඇත. එමෙන් ම නව සේවකයින් දෙදෙනෙකු බඳවා ගෙන ඇති අතර සේවකයින් 38 දෙනෙකු සේවයෙන් ඉවත් වී ඇත.

**මූල්‍ය තොරතුරු**

2024 වසරේ අධිකාරිය ලබා ඇති ආදායම රුපියල් මිලියන 286.41 ක් වූ අතර පුනරාවර්ථන වියදම් පියවීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් අරමුදල් ප්‍රමාණය රුපියල් මිලියන 593.01ක් වේ. 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 116.47 ක් ද මත්ස්‍ය බීජ තැන්පත් කිරීමේ වැඩසටහන සඳහා රු. මිලියන 200.00 ක් හා දියුණු තාක්ෂණයන් යොදා ගනිමින් දැනට පවතින විසිතුරු මත්ස්‍ය ගොවිපළ වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 34.66ක් ලබා දී ඇත.

තව ද ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් සහ ජලජීවී වගා සංවර්ධනය සඳහා ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ සඳහා ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය (ACIAR) වෙතින් රු. මිලියන 33.61ක් ජලජීවී වගා සංවර්ධනය සඳහා අධිකාරිය වෙත ලබා දී ඇත.

# තිරසර සංවර්ධනයට අනුකූල වීම

මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශය එහි සංවර්ධනය තුළින් තිරසර සංවර්ධන අරමුණු 1 දරිද්‍රතාවයෙන් තොර වීම, තිරසර සංවර්ධන අරමුණු 2 කුසගින්න තුරන් කිරීම, තිරසර සංවර්ධන අරමුණු 12 - වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය, තිරසර සංවර්ධන අරමුණු 14 - ජලය තුළ ජීවය ඇතුළුව තිරසර සංවර්ධන අරමුණු කිහිපයක් සාක්ෂාත් කර ගැනීමට දායක විය හැකි අතර ඒවා ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය හා කළමනාකරණය සඳහා වගකිව යුතු අමාත්‍යාංශයයේ සහ ආයතනවල කාර්යභාරය යටතේ සෘජුවම සම්බන්ධ වේ.

- තිරසර සංවර්ධන අරමුණු 1- දරිද්‍රතාවයෙන් තොර වීම - අධිකාරිය විසින් ජීවනෝපාය සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කර ඇති අතර 2023 වසරේ 94,754 ට සාපේක්ෂව 2024 දී මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශයේ නියැලී සිටින ධීවරයින් සහ වගාකරුවන් සංඛ්‍යාව 94,994 දක්වා ඉහළ ගොස් ඇත.

- තිරසර සංවර්ධන අරමුණු 2 - කුසගින්න තුරන් කිරීම - අපගේ ඉලක්කය වන්නේ කුසගින්න තුරන් කිරීම, ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසර ජලජීවී වගාව ප්‍රවර්ධනය කිරීම වන අතර මේ සඳහා මිරිදිය මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වගා පාදක මිරිදිය ධීවර හා ජලජීවී වගාව සංවර්ධනය කිරීම සඳහා අධිකාරිය විසින් වැඩසටහන් ආරම්භ කර ඇත. 2024 වර්ෂයේ මිරිදිය මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 103,120 ක් වූ අතර එය 2023 වර්ෂයේ මෙට්‍රික් ටොන් 114,850 ක නිෂ්පාදනයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 11,730 ක අඩු වීමකි.

- තිරසර සංවර්ධන අරමුණු 12 - වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය - ජලාශවල මත්ස්‍ය අස්වැන්න නැවුම් ලෙස ලබා ගත හැකි අතර මෙම මසුන් ජලාශ අවට හෝ ගම තුළ අළෙවි කරනු ලැබේ. ඉතිරි මත්ස්‍ය නිෂ්පාදනය නාගරික වෙළඳපළ වෙත නැවුම් ආකාරයකින් පැමිණෙමින් පවතින අතර තව ද මෙම අතිරික්ත නිෂ්පාදනය ගම් මට්ටමින් කරවල සඳහා වේලීම සිදු කරයි. සියලුම ධීවරයින් සහ වගාකරුවන් බලපත්‍රයක් සහිත ව ක්‍රියාත්මක වේ. සහ-කළමනාකරණ පිළිවෙත් හඳුන්වා දීම, වගකිව යුතු ධීවර කටයුතු සඳහා උදාහරණ වේ. එසේම සියලුම නව ජලජීවී වගා ව්‍යාපෘති පරිසර හිතකාමී ප්‍රවේශය භාවිත

කරන අතර මෙය වගකිය යුතු වගාව සහතික කරනු ඇති අතර අවසානයේ වගකීමකින් නිෂ්පාදනයක් ඇති කරනු ඇත.

- තිරසර සංවර්ධන අරමුණු 14 - ජලය තුළ ජීවය - අධික උපයෝජනය, නීති විරෝධී හෝ අනවසර මසුන් ඇල්ලීම, ජල දූෂණය යනාදිය හේතුවෙන් කරදිය මත්ස්‍ය අස්වැන්න වැඩි කිරීමට අපහසු බැවින් ප්‍රවණතාව වී ඇත්තේ සමුද්‍ර ජලජීවී වගාවයි. සමුද්‍ර ජලජීවී වගාව සඳහා පාරිසරික හිතකාමී ප්‍රවේශ වගාව ප්‍රවර්ධනය කිරීම හා වගා පද්ධති සඳහා පරිසර හිතකාමී ද්‍රව්‍ය යොදා ගනී. නොගැඹුරු මුහුදු ප්‍රදේශවල මුහුදු පැළෑටි වගාව ප්‍රවර්ධනය කරන අතර මුහුදු පැළෑටි මුහුදු ජලයේ $CO_2$ අවශෝෂණය කරයි. මෙය මුහුදු ජලයේ ආම්ලිකතාවය අඩු කිරීමට උපකාරී වේ. පාරිසරික හා කාර්මික තිරසර ආකාරයකින් දරා ගත හැකි ධාරිතාව සැලකිල්ලට ගනිමින් සමුද්‍රීය ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය හා පුළුල් කිරීම කරනු ලැබේ.

.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව, විගණනය කරන ලද ගිණුම් සහ විගණකාධිපති වාර්තා සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

## 1. හැඳින්වීම

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පැවති ජලජීවී වගා අංශය 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනත මඟින් 1999 ජනවාරි මස 29 වන දින ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (නැක්ඩා - NAQDA) බවට පත් කරන ලදි.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ පාලනය සිදු කරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළ සභාපතිවරුන් ලෙස බී. විජයරත්න මහතා (2023/09/04 – 2024/10/08) සහ කිත්සිරි ධර්මප්‍රිය මහතා (2024/10/09 – 2024/12/31) කටයුතු කළ අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ආචාර්ය ජේ.එම්. අශෝකා මහත්මිය කටයුතු කළ අතර 2024 වර්ෂය තුළ පහත සඳහන් නිලධාරීන් අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරන ලදී. අධිකාරිය ප්‍රධාන වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් යටතේ මිරිදිය ජලජීවී වගා සංවර්ධන, වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන, ව්‍යාප්ති, මූල්‍ය සහ මානව සම්පත් සංවර්ධන වශයෙන් අංශ 5කින් ද ඉංජිනේරු, නීති, අභ්‍යන්තර විගණන හා සැලසුම්, අධීක්ෂණ හා ඇගයීම් ලෙස ඒකක 4කින් ද සමන්විත වේ. 2024 වර්ෂය තුළ අංශ/ඒකක ප්‍රධානීන් ලෙස පහත නිලධාරීන් සේවය කළහ.

**ප්‍රධාන මෙහෙයුම් සහ උපකාරක සේවා අංශ / ඒකක**

| අංශය / ඒකකය | අංශ / ඒකක ප්‍රධානීගේ නම |
|---|---|
| මිරිදිය ජලජීවී වගා සංවර්ධන | එම්. වී. ධර්මදාස මහතා |
| වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන | එම්.ජී.ජී. ගුණසේන මහතා |
| ව්‍යාප්ති | ආර්. එච්. පොතුවිල මහතා |
| මානව සම්පත් සංවර්ධන | ඩබ්.එම්.අයි.කේ. විජේසේකර මහතා |
| මූල්‍ය | අනූෂා සරච්චන්ද්‍ර මෙනවිය |
| ඉංජිනේරු | එස්. ටී. විතානගේ මහතා |
| නීති | දිලූකා සුමනරත්න මහත්මිය |
| අභ්‍යන්තර විගණන | ජී.ඒ.ඩී.ඒ. පෙරේරා මහතා |
| සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ | කේ.එම්.ඩී.එම්. සෝමරත්න මහතා |

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි සංවිධාන ව්‍යුහය 24 පිටුවේ දක්වා ඇත.

පහත සඳහන් සියලුම මධ්‍යස්ථානවල සහකාර අධ්‍යක්ෂවරයකු හෝ ජලජීවී විද්‍යාඥවරයකු ස්ථාන භාර නිලධාරි වශයෙන් කටයුතු කරන අතර, ඔවුන්ගේ වගකීම වන්නේ දිවයින පුරා පවතින ජලාශ වල තැන්පත් කිරීමට අවශ්‍ය මත්ස්‍ය බීජ නිෂ්පාදනය කිරීම, විදේශීය සහ දේශීය වෙළඳපොළ සඳහා විසිතුරු මසුන් නිෂ්පාදනය කිරීම වේ.

| <u>මධ්‍යස්ථාන</u> | <u>නිෂ්පාදන විශේෂයන්</u> |
|---|---|
| උඩවලව (කාප්) | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප් |
| දඹුල්ල | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප් සහ තිලාපියා |
| ඉඟිණියාගල | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, තිලාපියා |
| නුවරඑළිය | සාමාන්‍ය කාපයා |
| උඩවලව (තිලාපියා) | තිලාපියා විශේෂ |
| ඉරණමඩුව | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප්,තිලාපියා |
| මුරුතවෙල | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප්, තිලාපියා |
| නව උඩවලව | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප් |
| කලාවැව | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, තිලාපියා |
| පොළොන්නරුව | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, තිලාපියා |
| පම්බල | මිරිදිය ඉස්සන් |
| කහඳමෝදර | මිරිදිය ඉස්සන් |
| කල්ලරාව | මිරිදිය ඉස්සන් |
| රම්බඩගල්ල | විසිතුරු මසුන් |
| ගිනිගත්හේන | විසිතුරු මසුන් |
| සෙවනපිටිය | විසිතුරු මසුන් |
| ඔලෙයිතුඩුවායි | මුහුදු කූඩැල්ලන් |

**මිරිදිය ජලජීවී වගා සංවර්ධනය**

මිරිදිය ජලජීවී වගා සංවර්ධන අංශය විසින් කළමනාකරණය කරනු ලබන මිරිදිය ජලජීවී වගා මධ්‍යස්ථාන අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂවරුන්, ස්ථාන භාර නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර මත්ස්‍ය බීජ නිෂ්පාදනය සහ ජලාශ, පොකුණු, කූඩු සහ කොටු වල තැන්පත් කිරීමට නිෂ්පාදකයින් සඳහා අඛණ්ඩව මත්ස්‍ය බීජ සැපයුමක් පවත්වා ගෙන යාම මූලික වගකීම වේ. මෙම අංශය විසින් කළමනාකරණය කරනු ලබන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන 10 ක් ඇත.

**ජලජීවී ව්‍යාප්ති සේවාව**

ව්‍යාප්ති අංශය යටතේ කළාප භාර සහකාර අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකුගේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල 22ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ (පළාත් හා දිස්ත්‍රික් මට්ටමින්). දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරීන් විසින් ව්‍යාප්ති කටයුතු, රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ කටයුතු , ජලජ සම්පත් කළමනාකරණය එනම් ජලාශවල මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම, ධීවරයින් දැනුවත් කිරීමේ කටයුතු හා අනවසර ධීවර කටයුතු වැළැක්වීම සහ තාක්ෂණික උපදෙස් ලබා දීමේ කටයුතු සිදු කරනු ලැබේ.

**වෙරළබඩ ජලජීවී වගා සංවර්ධනය**

වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන අංශය යටතේ වෙරළබඩ ජලජීවී වගා ව්‍යාප්ති හා අධීක්ෂණ ඒකක හතරක්, මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන තුනක්, විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන දෙකක් සහ විසිතුරු මත්ස්‍ය අභිජනන හා පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. මෙම සියලු මධ්‍යස්ථාන අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂවරුන්, ස්ථාන භාර නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජලජීවී වගාව සහ විසිතුරු මත්ස්‍ය වගා සංවර්ධනය කිරීමේ වගකීම දරයි.

**කලාවැව - ජාතික මිරිදිය ධීවර සහ ජලජීවී වගා පුහුණු ආයතනය**

මෙම ආයතනයේ ජලජීවී වගා අධිකාරියේ කාර්ය මණ්ඩලය, මිරිදිය ධීවරයන්, මසුන් වගා කරන්නන්, රාජ්‍ය නොවන ආයතන, ප්‍රජා මූලික සංවිධාන සහ උනන්දුවක් දක්වන පාර්ශව සඳහා මිරිදිය ධීවර සහ ජලජීවී වගා ක්ෂේත්‍රයට අදාළ පුහුණු වීම් පවත්වනු ලැබේ. තව ද

රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැලැස්වීම ද සිදු කරනු ඇත.

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ආයතනික ව්‍යුහය



## 02. අරමුණු

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අරමුණ වන්නේ විධිමත් මග පෙන්වීම තුළින් ජලජීවී වගා සංවර්ධනයට අවශ්‍ය රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, පර්යේෂණ සහ සංවර්ධනයන්, පුහුණු කිරීම් හා ව්‍යාප්ති කටයුතු යනා දී ක්‍රමවේදයන් තුළින් ශ්‍රී ලංකාවේ ජලජීවී වගාවේ තිරසර සංවර්ධනයයි. මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම තුළින් ආර්ථික සංවර්ධනය, ජනගහනයේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම, අපනයන වෙළඳපොළට ඉහළ වටිනාකමක් සහිත මත්ස්‍ය විශේෂ ඉදිරිපත් කිරීම සහ රැකියා අවස්ථා බහුල කිරීමෙන් සහ ආදායම් තත්ත්වය ඉහළ දැමීම තුළින් දිළිඳුකම අඩු කිරීම අධිකාරියේ අනෙකුත් අරමුණු වේ.

15/09/2011 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛන අංක 58(2) අනුව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ප්‍රවර්ධන ආයතනයක් (Promotional Institute) ලෙස වර්ගීකරණය කර ඇත.

## 03. <u>මානව සම්පත් තොරතුරු</u>

**2023** දෙසැම්බර් **31** දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මානව සම්පත පිළිබඳ තොරතුරු

| කාණ්ඩය | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ප්‍රධාන විධායක නිලධාරී | **01** | **01** | **-** |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් | **05** | **02** | **03** |
| මධ්‍ය මට්ටමේ කළමනාකරුවන් | **28** | **24** | **04** |
| කණිෂ්ඨ මට්ටමේ කළමනාකරුවන් | **99** | **76** | **23** |
| ජලජීවී විද්‍යාඥයින් | 69 | 50 | 19 |
| දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරීන් | 20 | 18 | 02 |
| සංඛ්‍යාලේඛන නිලධාරීන් | 03 | 03 | - |
| පරිගණක විශ්ලේෂක | 01 | 01 | - |
| ප්‍රසම්පාදන නිලධාරි | 01 | - | 01 |
| සමාජ සංවර්ධන නිලධාරි | 01 | 01 | - |
| මූල්‍ය නිලධාරි | 01 | 01 | - |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| අභ්‍යන්තර විගණන නිලධාරි | 01 | - | 01 |
| විමර්ශන නිලධාරි | 01 | - | 01 |
| කළමනාකාර සහකාර - තාක්ෂණික | **142** | **113** | **29** |
| ජලජීවී වගා සහකාර | 23 | 17 | 06 |
| ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරීන් | 110 | 103 | 07 |
| කළමනාකාර සහකාර | 03 | - | 03 |
| තාක්ෂණික නිලධාරීන් | 03 | 01 | 02 |
| පොත් තබන්නන් | 01 | 01 | - |
| වැඩමූලික | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | 01 | - | 01 |
| | | | |
| කළමනාකාර සහකාර - තාක්ෂණික නොවන | **83** | **66** | **13** |
| කළමනාකාර සහකාර | 82 | 65 | 13 |
| | 01 | 01 | - |
| ප්‍රාථමික මට්ටම | **436** | **318** | **48** |
| විදුලි/ යන්ත්‍ර කාර්මික | 11 | 06 | 05 |
| රියදුරු | 54 | 46 | 08 |
| රසායනාගාර සහායක | 03 | 02 | 01 |
| සංචාරක බංගලා භාරකරු | 08 | 03 | 05 |
| සුළු සේවකයින්* | 360 | 261 | 29 |
| එකතුව | **794** | **600** | **120** |

- කළමනාකරණ සහකාර තනතුරු 82 න් අනුමත තනතුරු සංඛ්‍යාව 78 ක් වන අතර 2014/10/24 දින චක්‍රලේඛය මගින් පුද්ගලික වශයෙන් ලබා දී ඇති තනතුරු 04ක් ඇත.
- කම්කරු තනතුරු 360 න් අනුමත තනතුරු සංඛ්‍යාව 290 ක් වන අතර 2014/10/24 දින චක්‍රලේඛය මගින් හිමිකරුට පමණක් පුද්ගලික වශයෙන් ලබා දී ඇති තනතුරු සංඛ්‍යාව 70 කි.
- කොන්ත්‍රාත් සේවකයන් 05 දෙනෙකු සිටී.
- එසේම, ජලජීවී වගාව ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා 123 දෙනෙකුගේ (සුළු සේවකයින්) සේවය බාහිර ආයතනයක් හරහා ලබාගෙන ඇත.

## බඳවා ගැනීම්

| | නම | පත්වීම් කාණ්ඩය | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|---|---|
| 01 | ඩී. ඒ. එස්. සරච්චන්ද්‍ර මෙනවිය | ස්ථිර | අධ්‍යක්ෂ (මූල්‍ය) | 27.04.2024 |
| 02 | කේ. ඒ. ටී. නවෝද්‍යා මහතා | ස්ථිර | ප්‍රසම්පාදන නිලධාරී | 03.06.2024 |

## සේවයෙන් ඉවත් වීම් / විශ්‍රාම ගැනීම්

| | නම | පත්වීම් කාණ්ඩය | තනතුර | දිනය |
|---|---|---|---|---|
| 1 | ඩබ්. ඒ ශ්‍රියානි මෙනවිය | විශ්‍රාමිකයි | කළමනාකාර සහකාර | 08.12.2024 |
| 2 | කේ.ඩී නිශාන්ත මහතා | අස්වීම | කළමනාකාර සහකාර | 22.07 2024 |
| 3 | ඩබ්.ප්‍රියරත්න මහතා | විශ්‍රාමිකයි | රියදුරු | 21.03.2024 |
| 4 | කේ.යෝගරාජ මහතා | විශ්‍රාමිකයි | කම්කරු | 21.08.2024 |
| 5 | යූ.එම්.ජේ.කිත්සිරි මහතා | අස්වීම | කම්කරු | 25.04.2024 |
| 6 | කේ.බී.කරුණාරත්න මහතා | විශ්‍රාමිකයි | කම්කරු | 15.10.2024 |
| 7 | ඒම්.පී.ආර්.ප්‍රේමසිරි මහතා | විශ්‍රාමිකයි | කම්කරු | 28.10.2024 |
| 8 | ඩී.එම්.ඒ.කේ දිසානායක මහතා | අස්වීම | කම්කරු | 02.03.2024 |
| 9 | එස්.එම්.දිසානායක මහතා | විශ්‍රාමිකයි | කම්කරු | 03.11.2024 |
| 10 | ආර්.එම්.ජී.රත්නායක මහතා | විශ්‍රාමිකයි | ජ්‍යෙෂ්ඨ ජලජීවී විද්‍යාඥ | 25.04.2024 |
| 11 | ර්.එස්.කේ හෙට්ටිආරච්චි මෙනවිය | අස්වීම | ජලජීවී විද්‍යාඥ | 01.02.2024 |
| 12 | ඩබ්.පී.ආර්.චන්ද්‍රරත්න මහතා | අස්වීම | මත්ස්‍ය රෝග විශේෂඥ | 28.09.2024 |
| 13 | පී.ජේමදාස මහතා | විශ්‍රාමිකයි | කම්කරු | 12.05.2024 |
| 14 | එස්.ඒ.එස් අබේවික්‍රම මහතා | අස්වීම | ජලජීවී වගා සහකාර | 18.09.2024 |
| 15 | කේ.වී.පී.ජේ මදුශංක මහතා | අස්වීම | ජලජීවී විද්‍යාඥ | 02.07.2024 |
| 16 | ආර්. නිශාන්තන් මහතා | අස්වීම | කම්කරු | 23.02.2024 |
| 17 | ඒස්. සායක්කාර මහතා | අස්වීම | කම්කරු | 05.03.2024 |
| 18 | එන්.බී.එන් මධුමාල් මහතා | අස්වීම | කම්කරු | 07.05.2024 |
| 19 | කේ.සී.ඉලංගසිංහ මහතා | අස්වීම | ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී | 25.09.2024 |
| 20 | ඒ.ඒ.ජේ අහමඩ් මහතා | අස්වීම | ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී | 12.01.2024 |

| | | | | |
|---|---|---|---|---|
| 21 | ආර්.එම්.බී.එස් ඒකනායක මහතා | අස්වීම | ජලජීවී විද්‍යාඥ | 26.09.2024 |
| 22 | ටී.ඒ විජේසේකර මහතා | අස්වීම | ජලජීවී විද්‍යාඥ | 31.05.2024 |
| 23 | ඩබ්.එම්.පී.කුමාර මහතා | අස්වීම | ජලජීවී විද්‍යාඥ | 31.01.2024 |
| 24 | ආර්.ජේ.එච්.කේ සන්දන මහතා | අස්වීම | ජලජීවී විද්‍යාඥ | 09.09.2024 |
| 25 | එච්.ජී.අයි.මධුවන්ති මෙනවිය | අස්වීම | සහකාර ජලජීවී විද්‍යාඥ | 03.04.2024 |
| 26 | ඒල්.ජී.ටී.ජනීෂා මෙනවිය | අස්වීම | කළමනාකාර සහකාර | 11.03.2024 |
| 27 | ඒ.ඒන්.පී.රත්නායක මහතා | අස්වීම | ජලජීවී විද්‍යාඥ | 25.06.2024 |
| 28 | එම්.ඒ. එම්. සිෆාන් මහතා | අස්වීම | කම්කරු | 24.02.2024 |
| 29 | කේ.සන්කේතන් මහතා | අස්වීම | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී | 30.09.2024 |
| 30 | ආර්.එස්.මධුෂාන් මහතා | අස්වීම | තාක්ෂණික නිලධාරී | 25.03.2024 |
| 31 | එම්.ඉලවාරසන් මහතා | අස්වීම | ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී | 04.03.2024 |
| 32 | කේ.ජී.සී.ජේ.කුමාර මහතා | අස්වීම | ජලජීවී විද්‍යාඥ | 31.03.2024 |
| 33 | අයි.යූ. දයාවංශ මහතා | අස්වීම | ජලජීවී විද්‍යාඥ | 31.07.2024 |
| 34 | පී.ආර්.ඩී.එම්. ජයසූරිය මහතා | අස්වීම | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී | 26.07.2024 |
| 35 | එස්.සිවශංකර් මහතා | අස්වීම | ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී | 30.05.2024 |
| 36 | ඩී.ආර්.ලියනආරච්චි මහතා | අස්වීම | ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී | 02.07.2024 |
| 37 | බී.එල්.පී.පී.ආර්. සාජ්තාරංග මහතා | අස්වීම | ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී | 26.01.2024 |
| 38 | කේ.පී.සී.ඩී.වීරසූරිය මහතා | අස්වීම | සහකාර ජලජීවී විද්‍යාඥ | 09.01.2024 |

## දේශීය පුහුණුවීම්

| | නම සහ තනතුර | පුහුණු වැඩසටහනේ නම | පුහුණු ආයතනය | පුහුණු වැඩසටහන පැවැත්වූ දිනයන් |
|---|---|---|---|---|
| 01 | එන්.එස්.ජසීමා මහත්මිය (කළමනාකාර සහකාර) | ලිපිකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | ධීවර අමාත්‍යාංශය | 04.03.2024 |
| 02 | ආර්.එම්.නිශානි මහත්මිය (කළමනාකාර සහකාර) | | | |
| 03 | අයි.එච්.ඒ.දෙණිය මහත්මිය (කළමනාකාර සහකාර) | | | |
| 04 | ජේ.ඒ.පී.මධුසංක මහතා (කම්කරු) | ජල නල තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 27.06.2024 |
| 05 | ආර්.එම්.ඒකනායක මහතා (කම්කරු) | | | |
| 06 | ඩබ්.ඩී.සී.සමන්ත මහතා (කම්කරු) | | | |
| 07 | බී.ඒ.ඩී.මාලික මහතා | රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියා | ශ්‍රී ලංකා ඉංජිනේරු | 30.06.2024 |

| | | | | |
|---|---|---|---|---|
| | (සිවිල් ඉංජිනේරු) | පටිපාටිය | ආයතනය | |
| 08 | මධුසංක පිටිගල මහතා (කළමනාකාර සහකාර) | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් පිළිබඳ පුහුණු පාඨමාලාව | දුරස්ථ ඉගනුම් මධ්‍යස්ථානය | 26.06.2024 |
| 09 | දීපිකා හේමකුමාරි මෙනවිය (කළමනාකාර සහකාර) | | | |
| 10 | අයේෂා නුවන්ධි මෙනවිය (කම්කරු) | | | |
| 11 | ඩී.ඒ.සරත්චන්ද්‍ර මෙනවිය (අධ්‍යක්ෂ මුදල්) | සම්මත ලංසු ලේඛනවලට අදාළ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ගැටළු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 26.06.2024 |
| 12 | බී.ඒ.ඩී.මාලික මහතා (සිවිල් ඉංජිනේරු) | | | |
| 13 | කේ.ඒ.ටී.නවෝදා මහතා (ප්‍රසම්පාධන නිලධාරී) | | | |
| 14 | ටී.එන්.එස්.දිසානායක මහත්මිය (කළමනාකාර සහකාර) | අභ්‍යන්තර පාලන පද්ධති සහ අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණු පාඨමාලාව | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 07.07.02024<br>08.07.2024 |
| 15 | බී.සී.පී.කුරේ මහතා (කළමනාකාර සහකාර)<br>වානිකා මදුශානි මහත්මිය (කම්කරු) | ගබඩා කළමනාකරණය සහ වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 20.08.2024<br>21.08.2024 |
| 16 | ආර්.ඒ.කේ.එස්.රාජපක්ෂ මහතා (මූල්‍ය නිලධාරි) | වැටුප් පරිවර්තන පුහුණු පාඨමාලාව | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 05.08.2024<br>06.08.2024 |
| 17 | දීපිකා හේමකුමාරි මෙනෙවිය (කළමනාකාර සහකාර) | | | |
| 18 | එස්.පී.අසංග රුවන් කුමාර මහතා (කළමනාකාර සහකාර) | අයකැමි තනතුරේ භූමිකාව පිළිබඳ පුහුණු පාඨමාලාව | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 08.08.2024 |
| 19 | කේ.ඒ.ටී.නවෝදා මහතා (ප්‍රසම්පාධන නිලධාරි) | රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | මෙට්‍රොපොලිටන් කැම්පස් | 01.08.2024 |
| 20 | කේ.එච්.ඒ.එස්.කුමාර මහතා (කළමනාකාර සහකාර) | ඇඩ්වාන්ස් එක්ස්එල් | මෙට්‍රොපොලිටන් කැම්පස් | 30.07.2024<br>31.07.2024 |

**විදේශීය පුහුණුවීම්**

| | නම | තනතුර | පුහුණු වැඩසටහන | ආයතනය / රට | කාලය |
|---|---|---|---|---|---|
| 1 | ඒ. අනෝජන් මහතා | ජලජීවී විද්‍යාඥ | Mariculture and aquatic produce processing technology for Sri Lanka | චීනය | 16.05.2024 05.06.2024 |
| 2 | එන්. එච්. එස්. ඩබ්. ක්‍රිශාන්ත මහතා | ජලජීවී විද්‍යාඥ | | | |
| 3 | බී. එම්. කේ. සෝසායි මහතා | ජලජීවී විද්‍යාඥ | | | |
| 4 | එල්. එච්. ඩබ්. සී. පුෂ්පකුමාර මහතා | ජලජීවී විද්‍යාඥ | | | |
| 5 | බී. නිරුපරාජ් මහතා | සහකාර අධ්‍යක්ෂ (වෙරළබඩ) | | | |
| 6 | ඩබ්. සී. ජයවීර මහතා | සහකාර අධ්‍යක්ෂ (විසිතුරු මත්ස්‍ය) | Clown fish breeding training Programme | තායිලන්තය | 03.07.2024 17.07.2024 |
| 7 | බී. එම්. පී. ක්‍රිශාන්ත මහතා | ජලජීවී විද්‍යාඥ | | | |
| 8 | පී. ජී. තරංග මහතා | ජලජීවී විද්‍යාඥ | | | |
| 9 | ඒ. එම්. ඒල්. ඩබ්. අධිකාරි මහතා | ජලජීවී විද්‍යාඥ | | | |
| 10 | බී. නිරුපරාජ් මහතා | සහකාර අධ්‍යක්ෂ (වෙරළබඩ) | Knowledge exchange program in kora : advanced seaweed value chain | කොරියාව | 18.11.2024 22.11.2024 |

## 4. <u>නඩු කටයුතු</u>

2024 වර්ෂයේ දී අධිකාරියට එරෙහිව අනෙකුත් ආයතන ගොනු කර පවත්වා ගෙන යන නඩු:

1. <u>වීරකෝන් ඉදිකිරීම් සමාගම එදිරිව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය - පොළොන්නරුව, වැලිකන්ද ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය ඉදි කිරීම</u>

   බේරුම්කරණයේ දී වැට් ද ඇතුළුව මුළු මුදල රු. 33,998,493/63 ක් 2024/03/15 දින ආර්. ඊ. වීරකෝන් සමාගමට ගෙවා බේරුම්කරණය සමථයට ලක් කර ගන්නා ලදි.

2. <u>වීරකෝන් කන්ස්ට්‍රක්ෂන් සමාගම එදිරිව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය - සෙවනපිටිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඉදි කිරීම.</u>

   බේරුම්කරණයේ දී වැට් ද ඇතුළුව මුළු මුදල රු. 21,390,451/18 ක් 2024/05/14 දින ආර්. ඊ. වීරකෝන් සමාගමට ගෙවා බේරුම්කරණය අවසන් කරන ලදී.

3. <u>ආර්.ඊ වීරකෝන් සමාගම එදිරිව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පොළොන්නරුව වැලිකන්ද මධ්‍යස්ථානය ඉදි කිරීම</u>
   <u>නඩු අංකය : **DSP** 220/2020</u>

2024/12/17 දින රු. 14,363,745/55 ක කාර්ය සාධන බැඳුම්කරය නිදහස් කිරීමෙන් **DSP** 220/2020 නඩුව සමථයට එළඹෙන ලදී.

4. <u>කිරුළ ඉංජිනියරින් සර්විසස් (පුද්) සමාගම එදිරිව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය</u>

   සමථ විනිශ්චයකරු අධිකාරියට වාසි සහගත ලෙස 2023/01/10 දින තීන්දුව ලබා දෙන ලද අතර එහි දී අධිකාරියට රු.8,147,748/63 ක් ගෙවීමට තීරණය විය. බේරුම්කරණය තවම අරඹා නොමැත.

5. <u>**LT/M**/26/24/2023 - ජී.ජී.එල්. ඉන්දික මහතා (කළමනාකාර සහකාර) විසින් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට එරෙහිව මාතර කම්කරු විනිශ්චයාධිකාරියෙහි පවරන ලද නඩුව:</u>

   නැවත රැකියාව ලබා දෙන ලෙස ඉල්ලා මාතර කම්කරු විනිශ්චයාධිකාරියෙහි ඉල්ලුම්කරු නඩු පවරන ලදි.

6. <u>කම්කරු විනිශ්චය සභා නඩු අංක - 39/15/2023 මාතලේ කළමනාකරණ සහකාර රජිතා හර්ෂණී සමරප්පෙරුම මහත්මිය විසින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට එරෙහිව මාතලේ කම්කරු විනිශ්චයාධිකාරියෙහි පවරන ලද නඩුව</u>

   ඉල්ලුම්කාරිය වන කළමනාකරණ සහකාර රජිතා හර්ෂණී සමරප්පෙරුම මහත්මිය විනය නියෝග 2 ක් පදනම් කර ගෙන තමාගේ සේවය අවසන් කිරීම බලරහිත කරන මෙන් ඉල්ලා මෙම නඩුව මාතලේ කම්කරු විනිශ්චයාධිකාරියෙහි අධිකාරියට එරෙහිව පවරා ඇත.

7. <u>නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය නඩු අංක - බස්.ක.01/04/බේරුම්/නැ.කො./37/2024- **CLE/COM/D**1/**M**/2024-01/0004 - කේ. එම්. ඩී. එම්. සෝමරත්න මහතා උඩවලව කාෆ් අභිජනන මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරී ලෙස කටයුතු කළ කාල සීමාවේ මව් මසුන් මිය යාමක් සම්බන්ධව ඔහුට විරුද්ධව සිදු කළ මූලික විමර්ශනයෙන් පසුව විනය බලධරයා දඬුවම් නියම කරන ලද අතර පසුව සෝමරත්න මහතාගේ ඉල්ලීම අනුව චෝදනා පත්‍රයක් ලබා දීමෙන් පවත්වන ලද විධිමත් පරීක්ෂණය</u>

   එම පරීක්ෂණයේ දී එක් චෝදනාවකට සෝමරත්න මහතා වරදකරු වූ අතර ඒ අනුව ඔහුට දඬුවම් නියම කරන ලදි. එම තත්වය අභියෝගයට ලක් කරමින් කේ. එම්. ඩී. එම් සෝමරත්න මහතා උතුරු කොළඹ කම්කරු කාර්යාලයට පැමිණිල්ලක් ගොනු කර ඇත එය මේ වන විට විභාග වෙමින් පවතී

2024 වර්ෂයේදී අධිකාරිය විසින් පවරා ඇති නඩු:

1. CHC/1298/22/ARB: ශ්‍රී ලංකා ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරිය එදිරිව ආර්. ඊ. වීරකෝන් ඉදිකිරීම් සමාගම

   ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය බේරුම්කරණය, ආර්. ඊ. වීරකෝන් සමාගමට රු. 33,998,493.63 ක් ගෙවා සමථ කර ගත් නිසා බේරුම්කරු ඉවත් කිරීමට අවශ්‍ය නොවීය.

2. දඹුල්ල දිසා අධිකරණ නඩු අංක - 2013/ එම් ආර් - ශ්‍රී ලංකා ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරිය එදිරිව ඩබ්. ඩී. එන්. විපුල වාහනයේ හිමිකරු සහ අනෙකුත් අය

   මෙම නඩුව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මගින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට අයත් අංක 253 – 3478 දරණ වාහනය හා ගැටුණු අංක WPLL 8305 දරණ වාහනයට සිදු වූ මුළු හානිය ශ්‍රී ලංකා රක්ෂණ සමාගමෙන් අය කර ගත නොහැකි වූ නිසා පවරන ලද්දකි.

3. ශ්‍රී ලංකා ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරිය එදිරිව ආර්. ඊ. වීරකෝන් ඉදිකිරීම් සමාගම - සෙවනපිටිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඉදි කිරීම

   බේරුම්කරණයේ දී ආර්. ඊ. වීරකෝන් ඉදිකිරීම් සමාගමට රු. 21,390,451.18 ක් ගෙවීමට නියම වූ අතර, ඒ අනුව රු. 21,390,451.18 ක් ආර්. ඊ. වීරකෝන් සමාගමට ගෙවා නඩුව අවසන් කරන ලදී.

## 5. ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල වල ප්‍රගතිය

***මිරිදිය ජලජීවී වගා සංවර්ධන අංශයේ ප්‍රගතිය***

*වගුව 6 - ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල මත්ස්‍ය බීජ නිෂ්පාදනය*

| ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන | පසු කීටයන් නිෂ්පාදනය (මිලියන) | ඇඟිලිත්තන් නිෂ්පාදනය (මිලියන) | ඇඟිල්ලන් නිෂ්පාදනය (මිලියන) |
|---|---|---|---|
| උඩවලව (කාප්) | 35.11 | 8.58 | 2.47 |
| උඩවලව (තිලාපියා) | - | 7.93 | 1.42 |
| නව උඩවලව | 0.60 | 9.80 | 2.22 |
| ඉඟිනියාගල | 56.20 | 17.58 | 6.27 |
| දඹුල්ල | 53.34 | 34.55 | 4.65 |
| ඉරණමඩු | 7.35 | 12.11 | 3.76 |
| මුරුතවෙල | 24.96 | 9.73 | 2.39 |
| නුවරඑළිය | - | 0.18 | 0.36 |
| සෙවනපිටිය | 14.98 | 12.19 | 2.33 |
| කලාවැව | 12.90 | 14.32 | 1.63 |
| එකතුව | **205.43** | **126.97** | **27.50** |

*මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය*

*වගුව 7 - මත්ස්‍ය බීජ නිකුත් කිරීම*

| ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය | *පසු කීටයන් (මිලියන)* | *ඇසිත්තන්* (මිලියන) | *ඇඟිල්ලන්* (මිලියන) |
|---|---|---|---|
| උඩවලව (කාප්) | 0.25 | 4.23 | 2.47 |
| උඩවලව (තිලාපියා) | - | 4.59 | 1.42 |
| නව උඩවලව | - | 2.86 | 2.22 |
| ඉඟිනියාගල | 2.53 | 10.60 | 6.27 |
| දඹුල්ල | 2.60 | 28.22 | 4.65 |
| ඉරණමඩු | - | 3.87 | 3.76 |
| මුරුතවෙල | 4.46 | 3.19 | 2.39 |
| නුවරඑළිය | - | 0.12 | 0.36 |
| සෙවනපිටිය | - | 7.15 | 2.33 |
| කලාවැව | - | 10.54 | 1.63 |
| එකතුව | **9.84** | **75.37** | **27.50** |

*මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය*

*වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන අංශයේ ප්‍රගතිය*

*වගුව **8** - මිරිදිය ඉස්සන් පසු කීටයන් නිෂ්පාදනය*

| ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය | *මිරිදිය ඉස්සන් පසු කීටයන්* (මිලියන) |
|---|---|
| කහඳමෝදර | 10.81 |
| පම්බල | 11.08 |
| කල්ලරාව | 5.36 |
| එකතුව | **27.25** |

*මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය*

*වගුව **9** - විසිතුරු මත්ස්‍ය, ජලජ පැළෑටි නිෂ්පාදනය හා පුහුණුලාභීන්*

| ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය | විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය (මිලියන) | ජලජ පැළෑටි නිෂ්පාදනය | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| රම්බඩගල්ල | 0.53 | 56,057 | 1,732 |
| ගිනිගත්හේන | 2.29 | 266 | - |
| සෙවනපිටිය | 1.21 | - | - |

*මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය*

*වගුව **10** - වෙරළබඩ ජලජීවී නිෂ්පාදනය*

| *වෙරළබඩ ජලජීවී වගා ව්‍යාප්ති සහ අධීක්ෂණ ඒකක* | ඉස්සන් නිෂ්පාදනය (මෙ. ටොන්) | මොදා මත්ස්‍ය නිෂ්පාදනය (මෙ. ටොන්) | මුහුදු කූඩැල්ලන් නිෂ්පාදනය (මෙ. ටොන්) | මුහුදු පැළෑටි නිෂ්පාදනය (මෙ. ටොන්) |
|---|---|---|---|---|
| උතුරු පළාත | 627 | 0.19 | 469 | 790.3 |
| නැගෙනහිර පළාත | 450 | 956 | - | 4.3 |
| වයඹ පළාත | 6144 | - | 10 | - |
| දකුණු පළාත | 99 | 22 | - | - |
| **එකතුව** | **7320** | **978.19** | **479** | **794.6** |

*මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය*

*වගුව 11-* මත්ස්‍යා ඇඟිල්ලන් හා මිරිදිය ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම

| දිස්ත්‍රික්කය | මත්ස්‍යා ඇඟිල්ලන් (මිලියන) | මිරිදිය ඉස්සන් පසු කීටයන් (මිලියන) |
|---|---|---|
| අම්පාර | 4.41 | 0.72 |
| අනුරාධපුර | 7.52 | 3.73 |
| බදුල්ල | 3.63 | 1.55 |
| මඩකළපුව | 4.33 | 0.45 |
| කොළඹ | 0.34 | 0.24 |
| ගාල්ල | 0.33 | 0.99 |
| ගම්පහ | 0.37 | 0.11 |
| හම්බන්තොට | 5.59 | 2.73 |
| යාපනය | 0.25 | - |
| කළුතර | 0.29 | 0.01 |
| මහනුවර | 3.68 | 1.46 |
| කෑගල්ල | 0.05 | - |
| කිළිනොච්චිය | 2.04 | 2.82 |
| කුරුණෑගල | 6.29 | 1.43 |
| මන්නාරම | 0.53 | 0.33 |
| මාතලේ | 7.41 | 1.33 |
| මාතර | 0.85 | 0.65 |
| මොණරාගල | 5.96 | 4.19 |
| මුලතිව් | 2.36 | 4.11 |
| නුවරඑළිය | 3.02 | 0.60 |
| පොළොන්නරුව | 5.84 | 2.45 |
| පුත්තලම | 3.06 | 3.83 |
| රත්නපුර | 3.49 | 0.40 |
| ත්‍රිකුණාමලය | 1.91 | 2.66 |
| වව්නියාව | 0.81 | 1.14 |
| **එකතුව** | **74.36** | **37.93** |

*මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය*

*වගුව 12 – මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය*

| දිස්ත්‍රික්කය | *මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය* (මෙ.ටොන්) |
|---|---|
| අම්පාර | 13,780 |
| අනුරාධපුර | 19,050 |
| බදුල්ල | 1,970 |
| මඩකළපුව | 3,800 |
| කොළඹ | 290 |
| ගාල්ල | 210 |
| ගම්පහ | 720 |
| හම්බන්තොට | 6,390 |
| යාපනය | 90 |
| කළුතර | 440 |
| මහනුවර | 1,210 |
| කෑගල්ල | 10 |
| කිළිනොච්චිය | 580 |
| කුරුණෑගල | 8,100 |
| මන්නාරම | 80 |
| මාතලේ | 1,650 |
| මාතර | 840 |
| මොණරාගල | 7,180 |
| මුලතිව් | 1,650 |
| නුවරඑළිය | 490 |
| පොළොන්නරුව | 11,120 |
| පුත්තලම | 3,100 |
| රත්නපුර | 1,270 |
| ත්‍රිකුණාමලය | 8,950 |
| වව්නියාව | 310 |
| **එකතුව** | **93,280** |

*මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය*

## 6. ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය

| වැඩසටහන / ක්‍රියාකාරකම | වෙන් වූ මුදල (රු.මි) | වියදම (රු.මි) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| **ප්‍රාග්ධන වියදම්** | | | |
| ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන 07 ක හදිසි සහ අර්ධ වශයෙන් නිම කරන ලද වැඩ කටයුතු සම්පූර්ණ කිරීම. (උඩවලව (කාප්), උඩවලව (තිලාපියා), උඩවලව නව, මුරුතවෙල, ඉඟිනියාගල, දඹුල්ල, ඉරණමඩුව) | 43.27 | 42.79 | උඩවලව (කාප්) මධ්‍යස්ථානයේ පැරණි චීන අභිජනනාගාරයේ ගොඩනැගිල්ලේ සහ ජල ගබඩා ටැංකියේ අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇත.<br>උඩවලව (තිලාපියා) මධ්‍යස්ථානයේ පොකුණු 02ක (B9, B10) කඩිනම් වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් කර ඇත.<br>උඩවලව නව මධ්‍යස්ථානයේ විකල්ප ජල මාර්ගය සහ පොකුණු 05ක කඩිනම් වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් කර ඇත.<br>ඉරණමඩුව මධ්‍යස්ථානයේ ජල සැපයුම් මාර්ගය, ජල ටැංකිය, අභිජනනාගාරය සහ ආශ්‍රිත කටයුතු වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් කර ඇත.<br>ඉඟිනියාගල මධ්‍යස්ථානයේ පොකුණු 10 ක කඩිනම් අලුත්වැඩියා කටයුතු ජල සැපයුම් මාර්ගය සහ රෝපණ ටැංකි පද්ධතිය ආශ්‍රිත කටයුතු අවසන් කර ඇත.<br>මුරුතවෙල මධ්‍යස්ථානයේ පොකුණු 02ක් සහ ඒ ආශ්‍රිත |

| | | | |
|---|---|---|---|
| | | | ජල මාර්ග සහ වැටෙහි අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇත.<br>දඹුල්ල මධ්‍යස්ථානයේ C8 පොකුණේ අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇත. |
| මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන (පම්බල, කහඳමෝදර), මිරිදිය ඉස්සන් ප්‍රදර්ශක ඒකකය (අගුණවැව), මුහුදු කුඩැල්ලන් අභිජනනාගාරය (ඔලෙයිතුඩුවායි) හි අවිච්ඡේද හා කඩිනම් වැඩිදියුණු කිරීමේ කටයුතු | 6.25 | 6.25 | අඟුණවැව පැති බැම්ම සහ කහඳමෝදර මධ්‍යස්ථානයේ වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් කර ඇත. |
| විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන වල අවිච්ඡේද හා කඩිනම් වැඩිදියුණු කිරීමේ කටයුතු (රම්බඩගල්ල, ගිනිගත්හේන, සෙවනපිටිය) | 10.11 | 10.11 | ගිනිගත්හේන කාර්යාල ගොඩනැගිල්ල සහ රෝපණ ටැංකි පද්ධතියේ අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇත.<br>සෙවනපිටිය මධ්‍යස්ථානයේ අපජල පද්ධතිය වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් කර ඇත. |
| ජාතික මිරිදිය ධීවර හා ජලජීවී වගා පුහුණු ආයතනයේ, ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල වල අවිච්ඡේද හා කඩිනම් වැඩිදියුණු කිරීමේ කටයුතු | 7.78 | 7.78 | ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේ ජල ආරක්ෂණ කටයුතු අවසන් කර ඇත.<br>කලාවැව ජල සැපයුම් මාර්ගයේ හදිසි අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇත. |
| සෙවනපිටිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය සඳහා බේරුම්කරණ තීරණයට අනුව ගෙවීම් පියවීම | 21.39 | 21.39 | ගෙවීම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| වාහන නඩත්තු කිරීම | 5.00 | 4.84 | වාහන 14ක් අලුත්වැඩියා කරන ලදි. |
| යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම | | | වායු සමීකරණ යන්ත්‍ර, මෝටර, ජනක යන්ත්‍ර, තණකොළ කපන යන්ත්‍ර අලුත්වැඩියා කරන ලදි. |
| තොරතුරු තාක්ෂණ සේවා | 9.41 | 4.82 | විද්‍යුත් තැපැල් සහ වෛරස් ආරක්ෂක මෘදුකාංග අලුත් කරන ලදි. UPS, ලැප්ටොප්, මුද්‍රණ යන්ත්‍ර, ප්‍රොජෙක්ටරය, මොනිටරය මිල දී ගන්නා ලදි. පරිගණක, මුද්‍රණ හා ස්කෑනර යන්ත්‍ර ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවන ලද අතර එක් ලංසුවක් පමණක් ඉදිරිපත් වූ බැවින් ප්‍රසම්පාදනය නවතන ලදි. |
| ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල මත්ස්‍ය බීජ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා රසායනාගාර උපකරණ මිලදී ගැනීම | 9.65 | 9.65 | 2023 වසරේ ප්‍රදානය කරන අයිතම භාර දෙන ලදි. අන්වීක්ෂය, ඩිජිටල් පරිමාණය, බහු ක්‍රියාකාරී මීටරය මිල දී ගන්නා ලදි. |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම | 2.75 | 2.52 | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල, ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන සහ ප්‍රධාන කාර්යාලය සඳහා ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිල දී ගන්නා ලදි. |
| ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල මත්ස්‍ය බීජ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම | 0.24 | 0.24 | තණකොළ කපන යන්ත්‍ර සහ ග්‍රිල් යන්ත්‍ර මිල දී ගන්නා ලදි. |
| වාහන ප්‍රසම්පාදනය | 3.45 | 3.45 | FAO ආයතනය හරහා මිල දී |

| | | | |
|---|---|---|---|
| | | | ගත් මත්ස්‍ය බීජ ප්‍රවාහන බවුසර් 3ක් සඳහා බදු ගෙවන ලදී |
| නිලධාරීන් සහ වගාකරුවන් පුහුණු කිරීම | 4.00 | 3.67 | **දේශීය පුහුණු**<br>නිලධාරීන් සඳහා රසායනාගාර පුහුණුව (16), රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි පුහුණුව (1), පොම්ප නඩත්තුව (3), මූල්‍ය රෙගුලාසි පිළිබඳ පුහුණුව (1), එක්සෙල් පිළිබඳ පුහුණුව (1) ලබා දී ඇති අතර ජාන විශේෂඥයාගේ ආචාර්ය උපාධි ලියාපදිංචිය සිදුකර ඇත.<br>**විදේශීය පුහුණු**<br>ඉන්දියාවේ පැවති 33 වන පාලක මණ්ඩල රැස්වීම (1), චීනයේ පුහුණුව (5), තායිලන්තයේ පුහුණුව (4) සහ ලෝක බැංකුව විසින් සංවිධානය කරන ලද කොරියාවේ පැවති රැස්වීම (2) සඳහා නිලධාරීන් සහභාගී විය. |
| **එකතුව** | **122.00** | **116.47** | |
| **ජලාශ වල මත්ස්‍ය ඇසිත්තන්, මත්ස්‍ය ඇඟිල්ලන් හා මිරිදිය ඉස්සන් පසුකීටයන් තැන්පත් කිරීම** | | | |
| මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම | 56.71 | 56.71 | ඇඟිල්ලන් මිලියන 13 තැන්පත් කර ඇත. |
| මත්ස්‍ය ඇසිත්තන් තැන්පත් කිරීම | 16.10 | 16.10 | ඇසිත්තන් මිලියන 14.62 තැන්පත් කර ඇත. |
| මිරිදිය ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම | 27.03 | 27.03 | මිරිදිය ඉස්සන් පසු කීටයන් මිලියන 13.52 තැන්පත් කර ඇත. |
| මත්ස්‍ය/ඉස්සන් බීජ නිෂ්පාදනය සඳහා මත්ස්‍ය ආහාර සහ ආටීමියා සැපයීම | 74.78 | 74.78 | මත්ස්‍ය ආහාර, ආටීමියා සපයා ඇත. |

| | | | |
|---|---|---|---|
| හෝමෝන, රසායනික ද්‍රව්‍ය, බිලිවිං, ට්‍රයික්ලෝර්ෆොන් සහ අනෙකුත් ආශ්‍රිත සේවාවන් සැපයීම | 25.38 | 25.38 | හෝමෝන, රසායනික ද්‍රව්‍ය, බිලිවිං, ට්‍රයික්ලෝර්ෆොන් සහ අනෙකුත් ආශ්‍රිත සේවාවන් සපයා ඇත. |
| **එකතුව** | **200.00** | **200.00** | |
| **කෘෂිකර්ම නවීකරණ වැඩසටහන යටතේ අභිජනනය, වගාව පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම සහ උසස් තාක්ෂණයන් යොදා ගනිමින් පවතින විසිතුරු මත්ස්‍ය ගොවිපළ වැඩිදියුණු කිරීම මගින් විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම** | | | |
| පවතින විසිතුරු මත්ස්‍ය ගොවිපළ උසස් තාක්ෂණයන් සමඟින් වැඩිදියුණු කිරීම සඳහා ණය නිකුත් කිරීම | 34.65 | 34.65 | ප්‍රතිලාභීන් 75 දෙනෙකුට ණය මුදල් නිකුත් කර ඇත. |
| පරිපාලන වියදම් | 0.35 | 0.01 | පරිපාලන කටයුතු සිදු කරන ලදී |
| **එකතුව** | **35.00** | **34.66** | |

## 7. ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යයන් වන්නේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහ මිරිදිය මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම, රැකියා අවස්ථා බිහි කිරීම, ජලජ සම්පත් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ප්‍රමාණය වැඩි කිරීම ඉලක්ක කර ගෙන ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් සහ ජලජීවී වගා කර්මාන්තයේ තිරසර සංවර්ධනය සහ කළමනාකරණය කිරීමයි.

## 8. ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 100% ක් භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධනය ආයෝජනය කරනු ලබන රජයේ ආයතනයකි. මෙහි අනුමත මූලික ප්‍රාග්ධනය රුපියල් මිලියන 90 කි.

## 9. ආදායම්

මත්ස්‍ය බීජ විකිණීමෙන්, මධ්‍යස්ථාන බදු දීමෙන් හා අනෙකුත් ආදායම් වශයෙන් අධිකාරිය ලබා ඇති ආදායම රුපියල් මිලියන 286.41 ක් වේ. 2024 දෙසැම්බර් 31 දිනෙන්

අවසන් වූ වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් පියවීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් අරමුදල් ප්‍රමාණය රුපියල් මිලියන 593.01ක් වේ.

## 10. අධිකාරියේ ක්‍රියාකාරකම්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය රුපියල් මිලියන (171.82) ක අලාභයක් ලබා ඇත.

## 11. කාර්යයන් පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 වන දිනට අධිකාරියේ ශේෂ පත්‍රය මූල්‍ය වාර්තාවේ දක්වා ඇත.

## 12. ප්‍රාග්ධන වියදම්

2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත රුපියල් මිලියන 122.00 ක ප්‍රාග්ධන වියදම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර දී තිබූ අතර ඉන් රුපියල් මිලියන 116.47 ක් ලබා දී ඇත. මෙම මුදල් ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම, ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සහ මිරිදිය ජලජීවී වගා සංවර්ධන කටයුතු සඳහා සම්පූර්ණයෙන්ම භාවිත කරන ලදී.

මීට අමතරව, මත්ස්‍ය බීජ තැන්පත් කිරීමේ වැඩසටහන සඳහා රු.මි. 200.00ක් වෙන් කරන ලද අතර, ඒ සඳහා රු. මිලියන 200.00 ලබා දී ඇත. තවද, කෘෂිකර්ම නවීකරණ වැඩසටහන යටතේ උසස් තාක්ෂණයන් යොදා ගනිමින් පවතින විසිතුරු මත්ස්‍ය ගොවිපළ වැඩිදියුණු කිරීම සඳහා අධිකාරිය වෙත රුපියල් මිලියන 34.66 ක් ලබා දී ඇත.

තව ද ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ ජලජීවී වගා සංවර්ධනය සඳහා ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ සඳහා ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය (ACIAR) වෙතින් රු. මිලියන 33.61ක් ජලජීවී වගා සංවර්ධනය සඳහා අධිකාරිය වෙත ලබා දී ඇත.

## 13. වෙනත් නියෝජිත ආයතන සමඟ සම්බන්ධතා

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ධීවර අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, සීමාසහිත සී-නෝර් පදනම, පළාත් සභා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර

අධිකාරිය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධ වී සහයෝගයෙන් කටයුතු කරන ලදි. එසේම පෞද්ගලික අංශය සමඟ එක්ව කිවුල්දිය ඉස්සන් අභිජනනාගාරය, රැකව ඉස්සන් වගා ගොවිපළ, වාකරේ ඉස්සන් ගොවිපළ සහ බංගදෙනියෙහි කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ක්‍රියාත්මක කරන ලදි.

## 14. <u>ආයතනය එළඹ ඇති කොන්ත්‍රාත් කෙරෙහි අධ්‍යක්ෂ වරුන්ගේ මැදිහත් වීම</u>

2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය තුල දී අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ආයතනය එළඹී ඇති කොන්ත්‍රාත්තු සඳහා සෘජුවම හෝ වක්‍රව මැදිහත් වීම් සිදු කොට නැත.

## 15. <u>විගණකවරු</u>

2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ගිණුම් විගණනය කරනු ලද්දේ රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසිනි.

මගේ අංකය / எனது இல. / My No. } එෆ්එල්එස්/ජ්/නැක්ඩා/1/එෆ්ජ්/2024/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 ජුනි 09 දින

සභාපති

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ,1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2හි 29 ඡේදය ප්‍රකාරව සෘජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී අතිරික්තය සමඟ ශුද්ධ මුදල් ප්‍රවාහය සසඳා හෙළිදරව් කළ යුතු වූවත් අධිකාරිය විසින් එසේ සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි ඡේද අංක 80(අ) සහ 81 ට පටහැනිව 2024 වර්ෂය තුළ වෙන්දේසි කරන ලද පිරිවැය රු. 3,129,555 ක්වූ වාහන හා යතුරුපැදි 13 කට අදාළව එහි පිරිවැය හා ඊට අදාළ සමුච්චිත ක්ෂය ප්‍රමාණයන් අදාළ ගිණුම්වලින් ඉවත් නොකර වාහන වෙන්දේසි කිරීම මඟින් ලද රු. 890,621 ක මුදල අධිකාරියේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීම සඳහා අමාත්‍යාංශයෙන් ලැබුණු රු.8,150,845 ක මුදල ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 11 හි 49 පරිදි අයහාරය ලෙස හඳුනා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අධිකාරිය වෙත විදේශ ප්‍රදාන වශයෙන් ලද මුළු ප්‍රදාන එකතුව රු.65,768,991 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 11 හි 95 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව ආදායමට හඳුනා ගැනීමකින් තොරව ව්‍යාපෘති ගිණුම් වලට බැර කර තිබුණි. එම වැඩසටහන් සඳහා සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.51,233,815 ක මුළු වියදමද ආදායම් ප්‍රකාශය තුළට නොගෙන ව්‍යාපෘති ගිණුම්වලට හර කර තිබුණි.

(ඉ) අධිකාරිය දේපළ, පිරියත උපකරණ ගිණුම් තබන ආකාරය හෙළිදරව් කර නොතිබූ අතර 2012 වර්ෂයේ ඉඩම් දෙකක් පමණක් ප්‍රත්‍යාගණන කර තිබුණි. 2024 වර්ෂයේ ඉඩම් කිහිපයක් තක්සේරු කර එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 පරිදි දේපළ , පිරියත හා උපකරණ වල සාධාරණ වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණු බැවින් පිරිවැය රු.2,703,182,770 ක දේපළ පිරියත උපකරණ හා පිරිවැය රු.854,727,329ක් වූ අභිජනනාගාර වත්කම් වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන තුළින් නිරූපණය වී නොතිබුණි.

(ඊ) අධිකාරිය විසින් අභිජනනයට යොදාගත නොහැකි මව් මත්ස්‍යයින් අලෙවි කරන සාමාන්‍ය වෙළඳපල මිල පදනම් කරගෙන, අභිජනනය සඳහා යොදාගත හැකි මව් මත්ස්‍ය තොගයද අගය කර ගිණුම්ගත කිරීම තුළින් අභිජනනය සඳහා යොදාගත හැකි මව් මත්ස්‍යයින්ගේ නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් නොවුණි.

(උ) ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් රු.මිලියන 143 ක් වැයකර මඩකලපුව දිස්ත්‍රික්කයේ බහු විශේෂ කරදිය වරල් මත්ස්‍ය අභිජනනාගාරයක් ඉදිකර 2017

ජූනි 29 වන දින අධිකාරියට භාරදී තිබුණි. එම වත්කම රු.155,450,000 ක් ලෙස අධිකාරිය විසින් තක්සේරු කර තිබුණද මේ දක්වා ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඌ) පුදුකුඩිරිප්පුහි පිහිටි රු.75,880,829 ක්වූ ඉස්සන් අභිජනනාගාරය, ජලජීවී වගා සංවර්ධන හා තත්ත්ව ප්‍රවර්ධන ව්‍යාපෘතිය විසින් 2009 දෙසැම්බර් 30 දින අධිකාරියට භාරදී තිබුණි. 2015 ජූනි 22 දිනැති තක්සේරු වාර්තාවට අනුව මෙම අභිජනනාගාර ඉඩම හා ගොඩනැගිල්ල රු.47,951,600 කටද, අනෙකුත් වත්කම් රු.3,146,550 කටද තක්සේරු කර තිබුණු අතර එම වත්කම් කිසිවක් මේ දක්වා ගිණුම් ගතකර නොතිබුණි.

(එ) 2014 ජූලි 16 දිනැති තක්සේරු වාර්තා අනුව බත්තුළුඔය ජලජීවී වගා කාර්යාලයේ ඉඩම රු.4,000,000 කට තක්සේරු කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ එම ඉඩම රු.2,599,000ක් ලෙස ගිණුම්ගත කර තිබූ බැවින් ජංගම නොවන වත්කම් රු.1,401,000කින් අඩුවෙන් දැක්වුණි.

(ඒ) 2017 සිට 2020 වර්ෂය දක්වා අමාත්‍යාංශ ප්‍රදාන වලින් ඉදිකර තිබුණු හම්බන්තොට රැකව ක්‍රැබ්සිටි අභිජනනාගාරය සඳහා වූ රු.221,719,566 ක වියදම ජංගම නොවන වත්කම් හා විලම්භිත ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණු අතර 2022 වර්ෂයේදී එම වටිනාකම විලම්භිත ආදායම් ගිණුමෙන් ඉවත් කර කල්බදු අවිනිශ්චිත ආදායම් ගිණුමක් ලෙස ජංගම නොවන බැරකම් යටතේ ඇතුලත් කර තිබුණද එම ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) රැකව මඩ කකුළු ව්‍යාපෘතිය බදු පදනම මත ලබාදුන් පුද්ගලික සමාගමෙන් 2024 දෙසැම්බර් 02 දිනට අයවිය යුතු රු. 7,440,769 ක බදු මුදල ලැබිය යුතු බදු ආදායම් ලෙස ගිණුම් ගතකර නොතිබීම හේතුවෙන් ජංගම වත්කම් සහ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුනි.

(ඕ) කල් ඉකුත් වූ කොන්ත්‍රාත් මත රඳවාගත් රු.10,321,732ක්වූ මුදල් රාජ්‍ය ආදායමට බැර කිරීම වෙනුවට අධිකාරියේ ආදායමට බැර කිරීම හේතුවෙන් වසරේ ලාභය එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම වෙනුවෙන් දරන ලද වියදම රු.99,844,016ක් වුවද සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ තුළ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මත්ස්‍ය පැටවු තැන්පත් කිරීම් වෙනුවෙන් රු.200,000,000 ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම්වල මුදල් ගලායැම් රු. 100,155,984 වැඩියෙන් දැක්වුණි.

(ග) රාජ්‍ය පෞද්ගලික හවුල් ගිවිසුම් යටතේ සමාලෝචිත වර්ෂයේ බදු කුලි වශයෙන් ලැබුණු රු.16,372,269 ක් සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්

ලැබීම් යටතේ දක්වා නොතිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම්වල මුදල් ගලා ඒම එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ච) ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණු රු.54,040,042 ක්වූ රජයේ ප්‍රදාන (ව්‍යාපෘති) නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව, වසර ගණනාවක සිට ඉදිරියට එමින් පැවති අතර එම ශේෂයේ පැවැත්ම හා නිවැරදිතාවය තහවුරු කිරීමට අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ජ) අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ඇතුළුව මධ්‍යස්ථාන 21 කින් මධ්‍යස්ථාන 05 ක පමණක් තොග සමීක්ෂණ සිදුකර තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති අවසාන තොග හා එම මධ්‍යස්ථාන විසින් ඉදිරිපත් කර තිබූ තොග වාර්තා අතර රු. 2,354,710 වෙනසක් නිරීක්ෂනය වූ බැවින් රු. 105,258,129 ක්වූ තොග ශේෂයෙහි නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය.

(ට) වෙනත් ගෙවිය යුතු ශේෂය යටතේ වූ උපචිත වියදම් තුළ රු. 413,340 ක හඳුනා නොගත් ශේෂයක් දක්වා තිබුණු අතර එහි පැවැත්ම හා නිවැරදිතාවය තහවුරු නොවීය.

(ඩ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.30,249,085 ක්වූ ණයහිමි ශේෂයක් සහ එකතුව රු.33,575,680 ක්වූ කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘති ණයගැති ශේෂ 74 ක් තහවුරු කර ගැනීම සඳහා මූලාශ්‍ර ලේඛණ, ශේෂ සනාථන ආදී ලේඛණ විගණනයට ඉදිරිපත් නොවූයෙන් එහි පැවැත්ම හා නිවැරදිතාවය විගණනයට තහවුරු නොවීය.

(ණ) අධිකාරිය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු බැවින් රු.2,703,182,770 ක්වූ දේපළ පිරියත උපකරණ සහ රු.854,727,329 ක්වූ අභිජනනාගාර වටිනාකමෙහි පැවැත්ම හා නිවැරදිතාව සනාථ කරගත නොහැකි විය.

(ත) දිවි නැගුම ගිණුම නමින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.74,981,435 ක බැර ශේෂයක් දක්වා තිබුණු අතර එම ශේෂයෙහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට අදාළ කිසිදු සාක්ෂියක් විගණනය වෙත ඉදිරිපත් නොවීය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ.මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවලප් සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ සඳහන් 1.2 (අ), (ඌ), (එ), (ඒ) සහ (ක) ඡේද හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේපාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක්සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති / විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසිය 104 හා 105 | ඉදිකිරීම් කොන්ත්‍රාත් 05 කින් සහ මත්ස්‍ය ආහාර මිලදී ගැනීමකින් අධිකාරියට රු.119,966,304 මුදලක් අහිමි වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා එම අලාභ හානි අදාල පාර්ශවයන්ගෙන් අය කරගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 137(2) | ගුණාත්මක තත්ත්වයෙන් තොරව සැපයුම් කර තිබුණු මත්ස්‍ය ආහාර සඳහා මුදල් රෙගුලාසියට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රු.18,888,505 ක් අදාල සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසිය 396 (ඇ) | 2025 මාර්තු 31 දිනට බැංකු ගිණුම් 2 කට අදාළව එකතුව රු.1,180,586 ක්වූ ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ චෙක්පත් 73 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 1994 අප්‍රේල් 20 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 30/94 (4.4) | රාජ්‍ය සංස්ථා විසින් ප්‍රයෝජනයට ගනු ලබන විදේශාධාර සම්බන්ධව වැය ඇස්තමේන්තුවට ප්‍රතිපාදන සලසා රේඛීය අමාත්‍යාංශය හරහා ආයතනය වෙත විදේශ ප්‍රදාන ලැබිය යුතු වූවද සමාලෝචිත වර්ෂයේ අධිකාරිය වෙත ලැබී ඇති රු.65,768,991 ක්වූ විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් එම විධි විධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2011 ආප්‍රේල් 21 දිනැති අංක MOEF/ERD/2011/01දරන චක්‍රලේඛය හා 2014 ජූනි 26 දිනැති අංක MOEF/ERD/2014/01 දරන චක්‍රලේඛය | විදේශ ප්‍රදාන ලබාදීම සහ ගිවිසුම්වලට එළඹීම සම්බන්ධ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම සහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සිදුවිය යුතු වූවද අධිකාරිය වෙත ලැබී ඇති රු.65,768,991 ක්වූ විදේශ ප්‍රදාන සම්බන්ධව ඒ අයුරින් කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3** වෙනත් කරුණු

(අ) තිලාපියා මත්ස්‍යයන් සඳහා අවශ්‍ය ආහාර නිපදවීමට 2019 ඔක්තෝබර් 08 දින උඩවලව මත්ස්‍ය ආහාර සැකසුම් මධ්‍යස්ථානයේ ස්ථාපිත කර තිබූ රු.11,802,000 ක් වටිනා මත්ස්‍ය ආහාර නිෂ්පාදන යන්ත්‍රය මගින් 2024 වර්ෂයේදී ආහාර නිෂ්පාදන කටයුතු සිදුකර නොතිබුණු අතර විගණිත දින වන 2025 අප්‍රේල් 04 දින වන විටත් යන්ත්‍රය නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) අධිකාරිය විසින් ජලජීවී වගා ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් අක්කර 14 ක් හා හෙක්ටයාර් 137.0294 ක්වූ ඉඩම් 05 ක් රජයේ ඉඩම් භාරදීම මත ලබාගෙන තිබුණද, එම ඉඩම් ජලජීවී වගා ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් උපයෝගී කර ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුනි.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනට ණයගැතියන් 84 දෙනෙකුගෙන් ලැබිය යුතුරු.23,557,079 ක ශේෂයක් වූ අතර ඒ තුළ වසර 1ත් වසර 3ත් අතර රු.17,471,907 ක්ද වසර 3ත් වසර 5ත් අතර රු.664,683 ක්ද, වසර 5 ඉක්මවූ රු.5,420,489 ක ශේෂයක්ද පැවති අතර එම ශේෂයන් අයකර ගැනීමටඅධිකාරිය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2024 දෙසැම්බර් 31 දිනට අයවීමට පැවති දිවි නැගුම ව්‍යාපෘතිය යටතේ බාහිර පාර්ශවයන්ට ලබාදෙන ලද රු.3,162,500ක ණය ශේෂය අයකර ගැනීමට අධිකාරිය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) අධිකාරිය විසින් මත්ස්‍ය වගා මධ්‍යස්ථාන බදු පදනමට ලබාදුන් පුද්ගලික ආයතන 06කින් 2023 සහ 2024 වර්ෂයන්ට අදාළව, 2024 දෙසැම්බර් 31 දිනට රු. 23,184,119 ක මුදලක් අයවීමට පැවති අතර මේ දක්වා බදු මුදල් අයකර ගැනීමට අධිකාරිය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) මඩකලපුව පුදුකුඩිරිප්පුහි පිහිටි ඉස්සන් අභිජනනාගාරය 2021 වර්ෂයේ දෙසැම්බර් 02 දින සිට වසර 05ක් කාලසීමාවන් සඳහා පුද්ගලික සමාගමක් වෙත බදුදී තිබූ අතර බදු කාලසීමාව අවසන් විමට පෙර 2024 ජූලි 01 දින මෙම ගිවිසුම අවසන් කර තිබුණි.ගිවිසුමේ කොන්දේසි 21 පරිදි ගිවිසුම අදාළ කාලපරිච්ඡේදයට පෙර අවසන් වුවහොත් අධිකාරියට සිදුවන අලාභය පියවා ගැනීම සඳහා වාර්ෂික බදු මුදලින් සියයට 50 කට සමාන එනම් රු. 3,000,000 කාර්යයසාධන බැදුම්කරයක් ලබාගත යුතු වුවද එසේ කාර්යයසාධන බැදුම්කරයක් ලබා ගෙන නොතිබුණි. අදාළ සමාගම විසින් අධිකාරියේ නිළධාරින් වෙත අභිජනනාගාරය සහ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ආපසු භාරගෙන තිබුණද අධිකාරියට අයවිය යුතු රු. 5,885,000 ක්වූ හිඟ බදු වාරික අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2022 මාර්තු 30 වන දින ඉදිකිරීම් අවසන් කර අධිකාරිය වෙත භාරදී තිබූ රු.17,041,113ක් වටිනා දඹුල්ල ජාන විද්‍යාගාර ගොඩනැගිල්ල මේ දක්වා භාවිතයට ගෙන නොතිබුණි.

(ඌ) දඹුල්ල ජාන විද්‍යාගාරය සඳහා අධිකාරිය විසින් මිලදී ගෙන ඇති රු.6,308,429 ක් වටිනා උපකරණ 08 ක් මේ දක්වා භාවිතයට ගෙන නොතිබුණි.

(ඔ) 2022 වර්ෂයේදී අවලංගු කරන ලද කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් අධිකාරියට අයවිය යුතු රු.1,540,507ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) අධිකාරියට හිමිකමක් නොමැති ඉඩම්වල පසු කීටයන් නිෂ්පාදනය සඳහා කුඩා පරිමාණ මත්ස්‍ය බිජ එකක ඉදිකිරීමේ කටයුතු සඳහා 2021 සිට 2023 වර්ෂය දක්වා රු.62,719,414 ක් ගෙවා තිබූ අතර එමගින් මේ දක්වා අධිකාරියට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ක) උපදේශන සේවා ආයතනයක් වෙත ජලජීවී උයනක් ඉදිකිරීම සඳහා උපදේශන සේවා සම්පූර්ණ කර නොතිබියදී 2016 හා 2017 වර්ෂවලදී රු.4,683,789 ක් ගෙවා තිබුණද 2022 වර්ෂයේදී ද එම ආයතනයට මෙම කොන්ත්‍රාත්තුව සඳහා රු.1,538,750 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද ඉදිකිරීම සම්පූර්ණ කර නොතිබූ බැවින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබූ අතර ගෙවීම්ද නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ග) වැලිකන්ද හා සෙවනපිටිය මත්ස්‍ය අභිජනනාගාර ඉදිකිරීම කොන්ත්‍රාත් අසාර්ථක වීම මත දිර්ඝ කාල දිගුවක් ලබාදී පසුව ඇවර කරණ ලදී. සමථකරණ හා බේරුම්කරණය වෙත සාධාරණ කරුණු දැක්වීම මඟින් ආයතනයට වාසි සහගත තීරණ ලබා ගැනීමට අපොහොසත් වීම මත අයකර ගත් ප්‍රමාද ගාස්තු නැවත ගෙවීම, එයට අදාල පොලිය සහ කොන්ත්‍රාත්කරුට ආදායම් අහිමි වීමට අදාලව රු.55,388,945 ක් අධිකාරිය විසින් කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුවී තිබුණි. මෙම මුදලට අමතරව රු.14,363,745 ක්වූ කාර්යයසාධන බැඳුම්කරය ද නියමිත කාලය තුළ මුදල් කර නොගැනීම නිසා එකතුව රු. 69,752,690 ක් අධිකාරියට අහිමි වී තිබුණි.

(ච) මත්ස්‍ය නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ මූලික අරමුණින් එකතුව රු.894,766,888 ක් වැය කරමින් මත්ස්‍ය අභිජනනාගාර 5ක් ඉදි කරනු ලැබුවද, 2020 සිට 2024 වර්ෂය දක්වා එම අභිජනනාගාර 5න් සෙවනපිටිය හා මන්නාරම මධ්‍යස්ථාන දෙකෙහි පමණක් මත්ස්‍ය පැටවුන් 6,257,241ක් අලෙවිකර රු.8,481,123ක ආදායමක් ලබගෙන තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට එයින් මන්නාරම මුහුදු කුඩැල්ලන් අභිජනනාගාරය රු.25,000 ක මාසික කුලි මුදලකට බදු දී තිබුණු අතර සෙවනපිටිය විසිතුරු මධ්‍යස්ථානය පමණක් ක්‍රියාත්මකව පැවතුණි. ඉතිරි මධ්‍යස්ථාන 03 ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.

(ජ) **රැකව ප්‍රදේශයේ කිවුල් දිය ඉස්සන් වගා කිරීමේ ව්‍යාපෘතිය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කිවුල් දිය ඉස්සන් වගාව සඳහා පෞද්ගලික ආයෝජන සමාගමක්, කකුළුවන් වගා කිරීමේ ජලජීවී සංවිධානයක් හා අධිකාරිය 2021 දෙසැම්බර් 02 දින ත්‍රෛ පාර්ශවීය බදු ගිවිසුමකට එළඹ මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි. අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනය අනුව 2021 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.221,719,566ක මුදලක් වැය කර තිබුණද ගිවිසුමේ 10 වන කොන්දේසිය අනුව පෞද්ගලික ආයෝජන සමාගම් මඟින් රු.193,460,000ක් පමණක් වසර 30ක් තුළ බද්දක්

ලෙස අධිකාරිය ලබා ගන්නා බැවින් අවම වශයෙන් අධිකාරිය විසින් සිදුකරන ලද වියදමවත් පියවාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

එසේම 2006 අංක 23 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි(සංශෝධන පනතේ) 5.4(උ) ප්‍රකාරව ජලජ සම්පත් ආනයනකරුවකු, අපනයනකරුවකු, අලෙවිකරුවකු සපයන්නෙකු හා බෙදාහරින්නකු ලෙස ව්‍යාපාර කරගෙන යාම අධිකාරියේ කර්තව්‍ය වන අතර ඒ අනුව කටයුතු නොකර ඉහත පරිදි අධිකාරියට මූල්‍ය අලාභයක් සිදුවන ලෙස සහ මහා පරිමාණ පෞද්ගලික සමාගමකට වාසිසහගත වන ලෙස ගිවිසුම්ගත වීම තුලින් පනත මගින් අධිකාරිය වෙත පැවරී ඇති කාර්ය්‍ය හා කර්තව්‍ය බාහිර පාර්ශවයන්ට පවරා ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ට) අධිකාරියට හිමිකාරිත්වය නොමැති හෙක්ටයාර් 1361.76 ක ඉඩම් 04 ක් සහ වපසරිය හඳුනාගත නොහැකි ඉඩමක් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු. මිලියන 107.6 ක මුදලක් වැයකර තිබුණද මේ දක්වා කිසිදු ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබූ බැවින් එම වියදම නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය**
**ආදායම් ප්‍රකාශනය**
2024 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

| | සටහන | 2024 වර්ෂයේ<br>රු. | 2023 වර්ෂයේ නැවත සකස්කරන ලදී<br>රු. | 2023 වර්ෂයේ විගණනය කරන ලද<br>රු. |
|---|---|---|---|---|
| මත්ස්‍ය බීජ ආදායම | 03 | 286,407,839.00 | 267,907,362 | 267,907,362 |
| විකුණුම් පිරිවැය | 04 | (218,843,213.58) | (234,181,224) | (347,509,506) |
| **දළ ලාභය / (අලාභය)** | | **67,564,625.42** | **33,726,138** | **-79,602,144** |
| **විනිමය නොවන පුනරාවර්තන ආදායම්** | | | | |
| භාණ්ඩාගාරයෙන් ලැබෙන පුනරාවර්තන ප්‍රදානය | | 593,009,298.69 | 529,066,000 | 529,066,000 |
| ප්‍රාග්ධන නොවන වියදම් සඳහා භාවිතා කරන ප්‍රාග්ධන ප්‍රදාන | | 140,574,002.42 | 29,443,977 | 29,443,977 |
| වෙනත් ආදායම් | 05 | 115,760,171.20 | 102,358,222 | 102,358,222 |
| ජීව තොග අගය කිරීමේ ලාභ /(අලාභ) | | 95,370.00 | 510,800 | 510,800 |
| අඩමාණ ණය අධිවෙන්කිරීම | | 965,445.80 | - | - |
| | | 850,404,288.11 | 661,378,998.68 | 581,776,854.25 |
| **විනිමය නොවන ප්‍රාග්ධන ආදායම** | | | | |
| භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන - 2201 | | 76,050,928.13 | 35,506,023 | - |
| භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන - 2202 | | 99,844,016.00 | 44,000,000 | - |
| ප්‍රාග්ධන ප්‍රදාන - ධීවර අමාත්‍යාංශය මඟින් | | 43,757,500.00 | 124,952,830 | - |
| තෑගි, පරිත්‍යාග (වත්කම්) - දේශීය සහ විදේශීය | | 48,467,738.00 | - | - |
| | | 268,120,182.13 | 204,458,852.68 | - |
| මුළු ප්‍රදාන-ප්‍රාග්ධන සහ පුනරාවර්තන | | **1,118,524,470.24** | **865,837,851** | **581,776,854** |
| පරිපාලන වියදම් | 06 | (829,111,751.52) | (807,947,225) | (820,793,071) |
| බෙදාහැරීමේ වියදම් | 07 | (112,719,909.77) | (152,239,276) | (152,239,276) |
| මූල්‍ය වියදම් | 08 | (285,990.95) | (346,911) | (346,911) |
| අනෙකුත් ප්‍රාග්ධන වියදම් | 09 | (397,389,565.21) | (315,877,442) | - |
| මුළු වියදම (පුනරාවර්තන සහ ප්‍රාග්ධන) | | -1,339,507,217.45 | -1,276,410,853.45 | -973,379,257.55 |
| විලම්භිත ආදායම | | - | - | 271,877,444.54 |
| **අතිරික්තය/හිඟය විස්තීර්ණ ආදායම/(වියදම) ගැලපීමට පෙර** | | **(153,418,121.79)** | **(376,846,864.09)** | **(119,724,958.76)** |

**අනෙකුත් විස්තීර්ණ ආදායම/(වියදම්)**

| | | | | |
|---|---|---|---|---|
| පාරිතෝෂික අතිරික්තය | 21.3 | - 18,406,239.64 | 63,456,423.49 | 38,137,717.63 |
| **කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය)** | | **-171,824,361.43** | **-313,390,440.60** | **-81,587,241.13** |

| **කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය)** | | | |
|---|---|---|---|
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය)-පුනරාවර්තන | - 42,554,978.35 | - 201,971,851.74 | - 81,587,241.13 |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය)-ප්‍රාග්ධන | - 129,269,383.08 | - 111,418,588.86 | - |
| | - 171,824,361.43 | - 313,390,440.60 | - 81,587,241.13 |

*සටහන් අංක 1 සිට 24 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් සටහන් සහ 1 සිට 7 දක්වා ඇති උපලේඛන මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි කොටසකි.*

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

**2024 දෙසැම්බර් 31 දිනට**

| | සටහන | 2024 වර්ෂයේ<br><br>රු. | 2023 වර්ෂයේ<br>නැවත ප්‍රකාශ කරන ලද<br>රු. | 2023 වර්ෂයේ<br>විගණනය කරන ලද<br>රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල, පිරියත හා උපකරණ | 10 | 2,703,182,769.88 | 2,723,825,834.62 | 2,723,825,833.37 |
| අභිජනන හා වෙළඳ වත්කම් | 11 | 854,727,328.96 | 847,589,629.82 | 847,589,629.78 |
| ජීව වත්කම් | 12 | 23,636,414.00 | 24,806,984.44 | 24,806,984.04 |
| නොනිමි | 13 | - | 97,971,206.22 | 97,971,206.42 |
| අනෙකුත් ජංගම නොවන වත්කම් | 14 | 221,719,566.45 | 223,796,736.48 | 223,796,736.48 |
| | | 3,803,266,079.29 | 3,917,990,391.58 | 3,917,990,390.09 |
| **කල්බදු වත්කම්** | | | | |
| කල්බදු වත්කම් | 15 | 586,666.66 | 613,333.33 | - |
| | | 586,666.66 | 613,333.33 | - |
| **අස්පෘශ්‍ය වත්කම්** | | | | |
| මෘදුකාංග | 16 | 6,041,499.52 | 6,996,320.77 | 6,996,320.77 |
| | | 6,041,499.52 | 6,996,320.77 | 6,996,320.77 |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | 17 | 81,621,714.72 | 76,277,101.72 | 76,277,101.72 |
| තැන්පත්, අත්තිකාරම් හා කලින් ගෙවීම් | 18 | 3,440,974.10 | 11,559,332.40 | 11,559,332.40 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 19 | 148,298,226.48 | 158,685,813.09 | 158,685,813.09 |
| අතැති මුදල් සහ බැංකුවේ මුදල් | 20 | 221,861,967.43 | 123,504,871.21 | 123,504,871.21 |
| | | 455,222,882.73 | 370,027,118.42 | 370,027,118.42 |
| **මුළු වත්කම්** | | 4,265,117,128.20 | 4,295,627,164.10 | 4,295,013,829.28 |
| **ස්කන්ධය** | | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | | (31,239,164.10) | (31,341,702.18) | 111,440,478.13 |
| රඳවාගත් ඉපැයීම් | | (758,027,193.32) | (468,281,510.86) | - 84,990,810.79 |
| සමුච්චිත අරමුදල - ප්‍රාග්ධනය | | 4,253,630,162.50 | 4,124,360,779.42 | - |
| වත්කම් ප්‍රත්‍යාගණන සංචිත | | 17,400,000.00 | 17,400,000.00 | 17,400,000.00 |
| **මුළු ස්කන්ධය** | | 3,481,763,805.08 | 3,642,137,566.38 | 43,849,667.34 |
| **බැරකම්** | | | | |
| **ජංගම නොවන බැරකම්** | | | | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 21 | 135,925,284.56 | 106,219,634.58 | 106,219,634.36 |
| විලම්භිත ආදායම් | | 0.00 | 0.00 | 3,598,282,565.23 |
| රජයේ ප්‍රදාන | 22 | 54,040,042.00 | 54,040,042.00 | 54,040,042.00 |
| කල්බදු ආදායම් අවිනිශ්චිත ගිණුම - (ක%eබ සිටි) | | 221,719,566.45 | 221,719,566.45 | 221,719,566.45 |
| කල්බදු - ණයහිමියෝ | 23 | 544,000.00 | 608,000.00 | - |
| | | 412,228,893.01 | 382,587,243.03 | 3,980,261,808.04 |
| **ජංගම බැරකම්** | | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 24 | 355,948,787.25 | 232,861,227.42 | 232,861,227.42 |
| කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් | | 15,175,642.86 | 38,041,126.47 | 38,041,126.47 |
| | | 371,124,430.11 | 270,902,353.89 | 270,902,353.89 |
| **මුළු බැරකම්** | | 783,353,323.12 | 653,489,596.92 | 4,251,164,161.93 |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | | 4,265,117,128.20 | 4,295,627,164.30 | 4,295,013,830.27 |

**සටහන් අංක 1 සිට 24 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් සටහන් සහ 1 සිට 7 දක්වා ඇති උපලේඛන මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි කොටසකි.*

............................................
**ඩී.ඒ සරත්චන්ද්‍ර**
අධ්‍යක්ෂ - මුදල්

............................................
**ආචාර්ය ජේ. එම්.අශෝකා**
අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

............................................
**කේ.පී කිත්සිරි ධර්මප්‍රිය**
සභාපති

............................................
**ඩී.ඒ.සී.ඩී. පීරිස්**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

## ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

## 2024 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

| | සටහන | පුනරාවර්ථන ප්‍රදාන රු. | ප්‍රාග්ධන ප්‍රදාන රු. | ප්‍රාග්ධන ප්‍රදාන (මත්ස්‍ය පැටවු තැම්පත් කිරීම) | සමුච්චිත අතිරික්තය/(හිඟය) රු. | වත්කම් ප්‍රත්‍යාගණන රු. | රඳවාගත් ඉපැයීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | | - | 528,878,007.47 | 0.00 | - | 17,400,000.00 | (132,751,687.64) | 413,526,319.83 |
| වර්ෂය තුළ ලැබුණු පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන | | 556,136,000.00 | 10,000,000.00 | 0.00 | - | - | - | 566,136,000.00 |
| ප්‍රාග්ධනිත වියදම් සඳහා අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | | - | 141,977,977.20 | | - | - | - | 141,977,977.20 |
| ප්‍රවර්ථන වර්ෂයේ විලම්භිත ආදයම් -ප්‍රාග්ධන ( එකතුකිරිම්) | **10** | - | (6,723,158.53) | | - | - | - | - 6,723,158.53 |
| ප්‍රවර්ථන වර්ෂයේ විලම්භිත ආදයම් -ප්‍රාග්ධන (ඉදිකිරිම්) | **උපලේඛනය-01** | - | 0.00 | | - | - | - | - |
| ප්‍රවර්ථන වර්ෂයේ විලම්භිත ආදයම් -අමාත්‍යාංශ (ඉදිකිරිම්) | **උපලේඛනය-01** | - | (691,301,670.29) | | - | - | - | - 691,301,670.29 |
| පුනරාවර්ථන ප්‍රදාන ලාභාලාභ ගිණුමට මාරු කිරිම | | (556,136,000.00) | - | | - | - | - | - 556,136,000.00 |
| ප්‍රාග්ධන නොවන වියදම් සඳහා දරණ ලද ප්‍රාග්ධන ප්‍රදාන | | - | (2,521,540.45) | | - | - | - | - 2,521,540.45 |
| මාළු පැටව් තැන්පත් කිරීමට අදාල බිල්පත් ගෙවීම සඳහා ප්‍රාග්ධන ප්‍රදාන යොදා ගැනීම. | | - | - | | | | - | - |
| ගැලපුම් | | | | | | | | |
| පෙර වර්ෂ ගැලපුම් | | - | (11,651,317.58) | | - | - | 19,281,819.18 | 7,630,501.60 |
| කාලපරිච්ඡේදයට අදාල ලාභය/(අලාභය) | | - | - | | - | - | 103,989,074.80 | 103,989,074.80 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | - | (31,341,702.18) | - | - | 17,400,000.00 | (9,480,794.66) | - 23,422,495.84 |
| **2024 ජනවාරි 01 දිනට ශේෂය** | | - | (31,341,702.18) | | - | 17,400,000.00 | (9,480,794.66) | - 23,422,496.84 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය තුළ ලැබුණු පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන | **උපලේඛනය-07** | 529,066,000.00 | 64,950,000.00 | 44,000,000.00 | | - | - | 638,016,000.00 |
| ප්‍රාග්ධනිත වියදම් සඳහා අමාත්‍යංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | | - | 124,952,829.79 | - | | - | - | 124,952,829.79 |
| ප්‍රවර්ථන වර්ෂයේ විලම්භිත ආදයම් -ප්‍රාග්ධන ( එකතුකිරිම්) | | - | (7,369,657.50) | - | | - | - | - 7,369,657.50 |
| ප්‍රවර්ථන වර්ෂයේ විලම්භිත ආදයම් -ප්‍රාග්ධන (ඉදිකිරිම්) | | - | (1,687,163.49) | - | | - | - | - 1,687,163.49 |
| ප්‍රවර්ථන වර්ෂයේ විලම්භිත ආදයම් -අමාත්‍යංශ (ඉදිකිරිම්) | **උපලේඛනය-01** | - | (8,619,851.38) | - | | - | - | - 8,619,851.38 |
| පුනරාවර්ථන ප්‍රදාන ලාභාලාභ ගිණුමට මාරු කිරිම | | (529,066,000.00) | - | - | | - | - | - 529,066,000.00 |
| ප්‍රාග්ධන නොවන වියදම් සඳහා දරණ ලද ප්‍රාග්ධන ප්‍රදාන | | - | (29,443,977.11) | - | | - | - | - 29,443,977.11 |
| මාළු පැටව් තැන්පත් කිරීමට අදාල බිල්පත් ගෙවීම සඳහා ප්‍රාග්ධන ප්‍රදාන යොදා ගැනීම. | | - | - | (43,999,997.00) | | - | - | - 43,999,997.00 |
| ගැලපුම් | | - | - | - | | - | - | - |
| පෙර වර්ෂ ගැලපුම් | | - | - | - | | - | 6,077,225.00 | 6,077,225.00 |
| කාලපරිච්ඡේදයට අදාල ලාභය/(අලාභය) | | - | - | - | | - | (81,587,241.13) | - 81,587,241.13 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | - | 111,440,478.13 | 3.00 | | 17,400,000.00 | (84,990,810.79) | 43,849,670.34 |
| **නැවත ප්‍රකාශ කිරීමට පෙර 2023 ජනවාරි 1 වන දිනට ශේෂය** | | - | 111,440,478.13 | 3.00 | - | 17,400,000.00 | (84,990,810.79) | 43,849,670.34 |
| විලම්භිත ආදයම් ශේෂය සමුච්චිත අරමුදලට මාරු කිරීම | | - | - | | 3,852,483,337.88 | - | - | 3,852,483,337.88 |
| ගැලපුම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන-මත්ස්‍ය පැටව් තැන්පත් කිරීමට | | | | (44,000,000.00) | | | | |
| ගැලපුම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන-වත්කම් මිලදී ගැනීම සඳහා | | - | 17,676,672.37 | | - | - | - | 17,676,672.37 |
| ගැලපුම් කළ ක්‍රමක්ෂය මුදල (විලම්භිත ආදායම) | | - | - | | - | - | - 271,877,444.54 | - 271,877,444.54 |
| ගැලපුම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන- ඉදිකිරීම් කටයුතු සඳහා | **උපලේඛනය-01** | - | - 35,506,022.89 | | | - | - | - 35,506,022.89 |
| ගැලපුම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන- ඉදිකිරීම් කටයුතු සඳහා- අමාත්‍යංශ | | 0.00 | - 124,952,829.79 | | 160,458,852.68 | - | 5,333.33 | 35,511,356.22 |
| ගැලපුම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන- මත්ස්‍ය පැටව් තැන්පත් කිරීමට අදාල | | - | - | 43,999,997.00 | - | - | - | 43,999,997.00 |
| ප්‍රාග්ධන හිඟය මාරු කිරීම | | - | - | | | - | (111,418,588.86) | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 111,418,588.86 | | | |
| **නැවත ප්‍රකාශයට පත් කිරීමෙන් පසු 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | (31,341,702.18) | - | 4,124,360,779.42 | 17,400,000.00 | (468,281,510.86) | 3,686,137,566.38 |
| **2024 ජනවාරි 1 වන දිනට ශේෂය** | - | - 31,341,702.18 | - | 4,124,360,779.42 | 17,400,000.00 | - 468,281,510.86 | 3,642,137,566.38 |
| වසර තුළ ලැබුණු ප්‍රදාන | 593,009,298.69 | 116,468,946.48 | 243,757,500.00 | | | | 953,235,745.17 |
| ප්‍රාග්ධන ප්‍රදාන ලාභ අලාභ මාරු කිරීම - විනිමය නොවන (ප්‍රාග්ධනය) | | - 76,050,928.13 | - | | | | - 76,050,928.13 |
| ප්‍රදාන ලාභ අලාභ මාරු කිරීම | (593,009,298.69) | - 40,418,018.42 | - 100,155,984.00 | | | | - 733,583,301.11 |
| ප්‍රාග්ධන ප්‍රදාන ලාභ අලාභ මාරු කිරීම - විනිමය නොවන (ප්‍රාග්ධනය) | | - | - 99,741,477.85 | | | | - 99,741,477.85 |
| ප්‍රාග්ධන ප්‍රදාන ලාභ අලාභ මාරු කිරීම - විනිමය නොවන (අමාත්‍යංශ) | | | - 43,757,500.00 | | | | - 43,757,500.00 |
| පෙර වසර ගැලපීම | | | | | | 11,348,062.05 | 11,348,062.05 |
| කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය) | | | | | | - 171,824,361.43 | - 42,554,978.35 |
| ප්‍රාග්ධන හිඟය වෙත මාරු කිරීම | | | | 129,269,383.08 | | - 129,269,383.08 | - |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | (31,341,702.25) | 102,538.15 | 4,253,630,162.50 | 17,400,000.00 | (758,027,193.32) | 3,611,033,188.16 |

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය
**2024 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා**

| | සටහන | 2024 වර්ෂය<br>රු. | 2023 වර්ෂය<br>රු. |
|---|---|---|---|
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය*** | | | |
| **ලැබීම්** | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන පුනරාවර්තන | | 593,009,298.69 | 529,066,000.00 |
| මත්ස්‍ය බීජ විකිණීමෙන් ලද මුදල | | 175,097,499.75 | 155,053,348.00 |
| වෙළඳ ණයගැති ලැබීම් | | 112,952,594.50 | 83,752,527.68 |
| වෙනත් ආදායම් | | 103,671,921.43 | 84,247,891.62 |
| මුළු මෙහෙයුම් ලැබීම් | | 984,731,314.37 | 852,119,767.30 |
| **ගෙවීම්** | | | |
| පරිපාලන වියදම් | | (819,218,739.50) | (734,680,849.28) |
| විකුණුම් සහ බෙදාහැරීම් වියදම | | (94,849,301.73) | (153,096,485.16) |
| මූල්‍ය වියදම් | | (285,990.95) | (346,910.67) |
| සැපයුම් කරුවන්ට ගෙවීම් | | (96,370,911.52) | (51,192,064.27) |
| විශ්‍රාම පාරිතෝෂික | | (8,801,004.39) | (10,022,109.69) |
| ණය හිමියන්ට ගෙවීම් | | (42,028,115.71) | (19,753,348.50) |
| මුළු මෙහෙයුම් වියදම් | | (1,061,554,063.80) | (969,091,767.57) |
| ශුද්ධ මුදල් ගලා ඒම් /ගලා යාම් | | (76,822,749.43) | (116,972,000.27) |
| **වෙනත්** | | | |
| ණය අයවීම් -කාර්ය මණ්ඩලය | | 32,354,718.50 | 27,059,036.51 |
| ණය ගෙවීම් -කාර්ය මණ්ඩලය | | (33,676,514.56) | (34,954,167.06) |
| වෙනත් වියදම් | | (270,773.41) | 4,917,772.00 |
| | | (1,592,569.47) | (2,977,358.55) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය** | | (78,415,318.90) | (119,949,358.82) |
| ***ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය*** | | | |
| දේපල පිරියත හා උපකරණ මිලට ගැනුම් | | (19,309,561.60) | (12,048,111.00) |
| අමාත්‍යාංශ ප්‍රදාන -ව්‍යාපෘති සඳහා | | (34,657,500.00) | (229,520,723.43) |
| විශේෂ භාණ්ඩාගාර ප්‍රදාන - මත්ස්‍ය පැටව් තැන්පත් කිරීම සඳහා | | (200,000,000.00) | (43,999,997.00) |
| වත්කම් ප්‍රග්ධනිතකරණය NAQDA ප්‍රාග්ධනය | | (54,759,069.22) | (21,207,128.96) |
| මත්ස්‍ය පැටව් තැන්පත් කිරීම සඳහා ගෙවීම් | | (33,831,403.45) | (4,847,549.00) |
| අනෙකුත් ව්‍යාපෘති වියදම් | | (45,353,133.61) | (18,546,248.56) |
| රඳවා ගැනීම් නැවත නිදහස් කිරීම | | (8,121,550.16) | (33,134,372.00) |
| **ආයෝජන ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(396,032,218.04)** | **(363,304,129.95)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය** | | | |
| විශේෂ භාණ්ඩාගාර ප්‍රදාන - මත්ස්‍ය පැටව් තැන්පත් කිරීම සඳහා | | 200,000,000.00 | 44,000,000.00 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන | | 116,468,946.55 | 64,950,000.00 |
| අමාත්‍යාංශයෙන් ලද ප්‍රදාන | | 51,791,840.64 | 256,413,270.31 |
| විදේශ ප්‍රදාන | | 65,789,492.10 | 14,264,997.73 |
| අරමුදල් සඳහා මුදල් ලැබීම් | | 63,156,305.27 | 19,125,803.29 |
| අනෙකුත් මුදල් ලැබීම් -මත්ස්‍ය පැටව් තැන්පත් කිරීම සඳහා | | 58,158,941.35 | 39,940,649.50 |
| ලැබිය යුතු ඉදිකිරීම් අයවීම් | | 17,439,107.25 | 0.00 |
| ප්‍රමාද පොලිය සහ සමථකරණ ගෙවීම් | | - | (12,226,488.66) |
| ද්‍රවශීලතා හානි වෙනුවෙන් අය කරන ලද මුදල් අමාත්‍යාංශයට නැවත ගෙවීම් | | | (13,803,267.75) |
| ***මූල්‍ය ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය*** | | **572,804,633.16** | **412,664,964.42** |
| **මුදල්, මුදල් හා සමාන අයිතමයන්ගේ වූ ශුද්ධ වැඩිවීම් / අඩුවීම්** | | 98,357,096.22 | (70,588,524.35) |
| **වර්ෂ ආරම්භක මුදල් හා මුදල් හා සමාන අයිතමයන්ගේ වටිනාකම** | | 123,504,871.21 | 194,093,395.56 |
| **වර්ෂ අවසාන මුදල් හා මුදල් හා සමාන අයිතමයන්ගේ වටිනාකම** | | **221,861,967.43** | **123,504,871.21** |
| ***මුදල්, මුදල් හා සමාන අයිතමයන්ගේ විශ්ලේෂණය*** | | | |
| වර්ෂ අවසානයට | | | |
| බැංකු ශේෂය (බැංකුවේ ඇති මුදල් ) | | 221,518,416.93 | 123,484,133.71 |
| මුදල් ශේෂය (අතැති මුදල් ) | | 343,550.50 | 20,737.50 |
| | | **221,861,967.43** | **123,504,871.21** |

*සටහන් අංක 1 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් සටහන් සහ 1 සිට 7 දක්වා ඇති උපලේඛන මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි කොටසකි.*

*N-1: PY ගැලපුම් යනු ආදායම් ගිණුමට වැරදි ලෙස බැර කරන ලද පෙර වසරවල ණයගැති එකතුව නිවැරදි කිරීමේ මුදලයි.*

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1. සංස්ථාපනය කිරීමේ තොරතුරු

### 1.1 පොදු කරුණු

1998 අංක 53 දරණ පනතින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ස්ථාපිත කර ඇති අතර ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ නියමයන්ට යටත් වේ. අධිකාරියේ ප්‍රධාන කාර්යාලය නො.41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ස්ථානයෙහි පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන කර්තව්‍ය හා මෙහෙයුම් ස්වභාවය

වර්ෂය තුල අධිකාරියෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ,

- ජලජීවී වගාව හා ජලජීවී මෙහෙයුම් සංවර්ධනය කිරීම තුලින් රට තුල මත්ස්‍ය නිෂ්පාදනය සහ මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම.
- මිරිදිය හා වෙරළ ආශ්‍රිත ජලජීවී වගාව සංවර්ධනය කිරීම තුලින් රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම.
- අපනයනය සඳහා විසිතුරු මසුන් ඇතුළු ඉහළ වටිනාකමින් යුත් මත්ස්‍ය විශේෂ වගාව ප්‍රවර්ධනය කිරීම.
- පරිසර හිතකාමී ජලජීවී පුහුණු ක්‍රම තුලින් ජලජ සම්පත් ප්‍රශස්ථව උපයෝගී කර ගැනීම සඳහා පහසුකම් සැපයීම.
- කුඩා, මධ්‍ය පරිමාණ හා විශාල පරිමාණ පුද්ගලික අංශයේ ජලජීවී වගාව ප්‍රවර්ධනය කිරීම හා ස්ථාපනය කිරීම.
- දූර්වල ජලජීවී වගාවන් මගින් විනාශයට පත් ජලජ සම්පත් සංරක්ෂණය හා පුනරුත්ථාපනය කිරීම.

### 1.3 නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන දිනය

අලුතින් සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් හෝ නීති, පූර්ණ හෝ කොටසක් සම්මත කර ගැනීමට අධිකාරිය බැදෙන තෙක් හෝ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තෙක් මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් 2017/01/01 දින සිට තවදුරටත් වලංගු වේ.

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### 2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

මෙම ගිණුම් වාර්තා පිළියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මත වේ. කාලපරිච්ඡේදයේ තක්සේරු කිරීමේ දී පිළිබිඹු වන උද්ධමන වත්කම් සඳහා කිසිදු ගැළපීමක් සිදු නො කෙරේ.

### 2.2 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කරන ලද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන වලට අනුකූලව වේ.

### 2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ බැංකුවෙහි ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය.

### 2.4 සංසන්දනාත්මක තොරතුරු

අධිකාරිය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් නිශ්චිතව ම අඛණ්ඩව භාවිත කර ඇති අතර, වෙනත් ආකාරයකින් ප්‍රකාශිත නැත්නම් පෙර වර්ෂයේ භාවිත කළ ඒවා සමඟ අනුකූල වේ.

### 2.5 ප්‍රමාණාත්මකතාවය සහ සමාහරණය

